# 4

# ලිංගික අපයෝජනයට ගොදුරුවී විකල්ප රැකවරණයට යොමු වූ ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා සමාජ වැඩමැදිහත්කරණයේ අවශ්‍යතාවය

බී.කේ.එස්. කරුණාරත්න, පුහුණු නිලධාරි
කීර්ති ජයවර්ධනය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි

## සංක්ෂිප්තය

ළමා ලිංගික අපයෝජනය නූතන ලෝකයේ දක්නට ලැබෙන ප්‍රබල සමාජ ප්‍රශ්නයකි. මේ සඳහා ගොදුරු වන ළමුන් අතරින් ගැහැණු ළමුන් සුවිශේෂී වේ. ගැහැණු ළමුන්ගේ සංවර්ධනයට එමගින් වන බලපෑම ප්‍රබලය. ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වන ගැහැණු ළමුන් ආයතනගත හා ප්‍රජාපාදක රැකවරණයන්ට යොමු කරමින් ඔවුන් සඳහා අවශ්‍ය රැකවරණය සැලසීම අතීතයේ සිටම සිදු වූ අතර මෙවැනි ළමුන් සෘජුවම ආයතනගත රැකවරණයට යොමු කිරීමෙන් බැහැරව විකල්ප රැකවරණයන්ට යොමුකිරීම කෙරෙහි විශේෂ අවධානයක් 2010 වර්ෂයේ සිට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් යොමුකොට තිබේ. එහි සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව 2019 වර්ෂයේ සිට එය තම රටේ ජාතික ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාවට නංවනු ලබයි. විකල්ප රැකවරණයෙහි සාර්ථකත්වය කෙරෙහි එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් ප්‍රධාන මූලධර්මයක් වන **"උපරිම යහපත"** පිළිබඳ මූලධර්මය ඵලදායී ලෙස ක්‍රියාවට නැංවිය යුතුය. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ සඳහන් පරිදි ළමුන් සම්බන්ධව කටයුතු කරන සියලුම පාර්ශ්වයන් එහිදී ළමුන්ගේ උපරිම යහපත පිළිබඳව සලකා බැලීමට ක්‍රියා කළ යුතුය. මෙම පර්යේෂණය මගින් උත්සාහ කොට ඇත්තේ ලිංගික අපයෝජනයේ වින්දිතයින් බවට පත් ව විකල්ප රැකවරණයේ සිටින ගැහැණු ළමුන්ගේ උපරිම යහපත කවරාකාරයෙන් සිදුවේදැයි විමසා බැලීමයි. මෙවැනි ආන්තික ළමුන්ගේ උපරිම යහපත සඳහා සමාජවැඩ මැදිහත්කරණය ඉතා වැදගත් වන අතර ලෝකයේ බොහෝ රටවල් එය සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබයි. සමාජ වැඩ යනු ප්‍රායෝගික භාවිතය පදනම් වූ වෘත්තියකි. මෙම වෘත්තිය මානව සම්බන්ධතා පිළිබඳව විද්‍යාත්මක දැනුම සහ කුසලතා මත පදනම් වූවක් වන අතර මෙම වෘත්තිය මගින් පුද්ගලයන්ගේ පෞද්ගලික තෘප්තිය සහ ස්වාධීනත්වය සමාජමය තෘප්තිමත්භාවය හා ස්වාධීනත්වයක් ගොඩනැගීමට උපකාර කරනු ලබයි. සමාජ වැඩ පුද්ගලයන්ගේ විභව ශක්තීන් හඳුනාගනිමින් ගැටලු විසඳාගැනීම සඳහා සංවර්ධනාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සමාජ වැඩ මැදිහත්කරණය මගින් ළමුන්ගේ උපරිම යහපත සඳහා අවශ්‍ය සාධනීය පරිසරයක් සැකසීමට හැකියාව තිබේ. නමුත් ශ්‍රී ලංකාව තුළ ලිංගික අපයෝජනයේ ගොදුරු බවට පත් ව විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා සමාජ වැඩ මැදිහත්කරණය අවම මට්ටමක පවතින හෙයින් එහි අවශ්‍යතාවය සොයා බැලීමට මෙම පර්යේෂණය සිදුකරන ලදී. ගුණාත්මක පර්යේෂණයක් වන මෙම පර්යේෂණයේ නියැදිය ලෙස යොදාගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ ළමාරක්ෂණය සඳහා කටයුතු කරන ප්‍රධාන රාජ්‍ය ආයතනයක් වන වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වර්තමානයේ විකල්ප රැකවරණයේ

පසුවන ගැහැණු ළමුන්ය. ලිංගික අපයෝජනයට ගොදුරුවීමෙන් අනතුරුව අධිකරණ නියෝග මත විකල්ප රැකවරණය සඳහා යොමු කොට ඇති ගැහැණු ළමුන් 10 දෙනෙකු අරමුණුගත නියැදීම ඔස්සේ තෝරාගන්නා ලද අතර දත්ත රැස්කිරීමේදී සිද්ධි අධ්‍යයන විධික්‍රමය ප්‍රධාන වශයෙන් යොදා ගෙන ඇත. තවද නියමු සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණ ක්‍රමය මගින්ද පර්යේෂණයට අවශ්‍ය ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. මෙහි දත්ත විශ්ලේෂණය සඳහා තේමා විශ්ලේෂණය භාවිතා කොට ඇත. පර්යේෂණයේ මූලික සොයා ගැනීම් අනුව ලිංගික අපයෝජනයට ලක් වී විකල්ප රැකවරණයේ පසු වන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත නිසියාකාරව සිදු නොවේ. විශේෂයෙන්ම ඔවුන්ගේ ආරක්ෂාව, සංවර්ධනය, යහපැවැත්ම, සුභසාධනය හා පුනරුත්ථාපනය යන කාරණා පිළිබඳව සැලකිලිමත්වීමේදී නියැදියෙන් බහුතරයක් විවිධාකාරයේ ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දී සිටී. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ සුවිශේෂී කාරණය වන්නේ අධ්‍යාපන අයිතිය ප්‍රධානකොට ගත් ළමා අයිතිවාසිකම් රාශියක් මොවුන්ට අහිමි වී ඇති බවයි. ළමුන් සඳහා ශ්‍රී ලංකාවෙහි වර්තමානයේ පවතින රාජ්‍ය ප්‍රතිපත්ති ඵලදායක අන්දමින් යොදාගැනීමට අපොහොසත්වීම තුළ මෙම ළමුන් තවදුරටත් ආන්තීකරණයට පත්වීම හේතුවෙන් ඔවුන්ගේ උපරිම යහපත බරපතල අභියෝගයකට ලක්වී ඇති බවද මෙම පර්යේෂණයේදී හඳුනාගන්නා ලදී. එබැවින් මෙවැනි ආන්තික ළමුන්ගේ උපරිම යහපත සඳහා සමාජවැඩ වෘත්තීය මැදිහත්වීමක අවශ්‍යතාවය පැහැදිලිවන හෙයින් ඉදිරියේදී ඔවුන්ගේ උපරිම යහපත ඇති කිරීම සඳහා පරිවාස කාර්යාල මට්ටමින් කටයුතු කරන සමාජ වැඩ වෘත්තිකයින්ගේ සේවය අත්‍යාවශ්‍ය බව පෙන්වා දී තිබේ.

**මුඛ්‍ය පදඃ** *ළමා ලිංගික අපයෝජනය, ළමා අයිතිවාසිකම්, උපරිම යහපත, විකල්ප රැකවරණය, සමාජවැඩ මැදිහත්කරණය*

**හැඳින්වීම**

ළමා රැකවරණය යනු දරුවකුගේ ආරක්ෂාව හා සුභසාධනය රැකගැනීමයි (ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය, 2019). ළමා රැකවරණය නූතන සමාජයට අත්‍යාවශ්‍ය වී තිබේ. ළමුන්ගේ උපරිම යහපත ඇති කිරීම ළමා රැකවරණයේ පරමාර්ථය වන හෙයින් ඒ සඳහා හැකි සෑම උත්සාහයක්ම ගැනීමට වග බලා ගත යුතුය. ළමා රැකවරණයේදී මූලිකව වැදගත් වන්නේ ළමයා ජීවත්වන පවුල හා සමාජයයි. ස්වකීය දෙමව්පියන්ගේ පවුල් පරිසරයෙන් පරිබාහිරව අධිකරණ නියෝගයකින් හෝ එවැනි බලයක් සහිත ආයතනයක් මගින් දෙනු ලැබූ තීරණයක් මත දරුවන් විකල්ප ළමාරැකවරණයට යොමු කිරීම නූතනයේදී හඳුනාගත හැකි අතර ඒ අතරින් ලිංගික අපයෝජනයට ගොදුරු වූ ගැහැණු ළමුන් සුවිශේෂී වේ.

ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්පය රැකවරණය යටතේ පසුවන ගැහැණු දරුවන් සමාජය තුළ නොයෙකුත් ආකාරයේ අයිතිවාසිකම් උල්ලංඝනයන්ට ලක් වන බව පැහැදිලිව දක්නට ඇතත් ඒ පිළිබඳව ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ සිදුකිරීමට පර්යේෂකයින් උනන්දු වී ඇත්තේ අල්ප වශයෙනි. එයට හේතුව විකල්ප රැකවරණයේ පසුවන බොහෝ ගැහැණු ළමුන් අධිකරණ නියෝග යටතේ පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පසුවීම හා එම නිලධාරීන් අධිකරණයේ විභාගවෙමින් පවතින නඩුවල තොරතුරු බාහිර පුද්ගලයින් වෙත ලබාදීමට ක්‍රියා නොකිරීමයි. ආයතනගත ළමුන් පිළිබඳව තොරතුරු

ලබාදීමට කටයුතු කළද විකල්ප රැකවරණය යටතේ පසුවන ළමුන්ගේ තොරතුරු ලබාදීමට බොහෝදුරට ක්‍රියා නොකිරීම හේතුවෙන් මේ පිළිබඳව පර්යේෂණ අවම මට්ටමක පවතින බව පෙනේ. ලිංගික අපයෝජනයට ලක් වන ගැහැණු දරුවන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේදී අභියෝග රාශියක් නූතන සමාජ සන්දර්භය තුළ හඳුනාගත හැකිය විශේෂයෙන්ම ඔවුන්ට හිමි ළමා අයිතිවාසිකම් විශාල වශයෙන් උල්ලංඝනය වන බව පැහැදිලිවම හඳුනාගත හැකි කාරණයකි. එබැවින් ඔවුන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් හා රාජ්‍ය නොවන අංශවල සියලු දෙනාගේ ඵලදායි මැදිහත්කරණය අත්‍යවශ්‍ය වී ඇත ඒ සඳහා 1989 වර්ෂයේ සම්මත කරන ලද ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මාර්ගෝපදේශ සපයයි. එම ප්‍රඥප්තිය තුළ ළමුන්ට හිමි අයිතිවාසිකම් ලිංගික අපයෝජන ලක්වූ දරුවන්ට ද ඒ හා සමානව භුක්ති විඳීමේ අයිතිය රජය විසින් තහවුරු කර දීමට බැඳී සිටී. මෙම පර්යේෂණය තුලදී පර්යේෂකයා අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය ලිංගික අපයෝජනයට ලක් වූ ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා කොතෙක් දුරට කටයුතු කරන්නේද යන්න හා ඒ සඳහා අයිතිවාසිකම් පදනම් කරගත් සමාජ වැඩ මැදිහත්කරණයේ අවශ්‍යතාවය පරීක්ෂාකර බැලීමයි.

මෙම පර්යේෂණය කාලීන වශයෙන් ඉතා වැදගත් පර්යේෂණයක් වන්නේ අන්තර්ජාතික වශයෙන් විකල්ප රැකවරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇති පසුබිමක, ශ්‍රී ලංකාවද විකල්ප රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්මත කරගනිමින්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා රජය යොමු වී තිබීමයි. ඒ අනුව වර්තමානයේදී ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණය යටතේ සිටින ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වීම කෙසේ සිදුවන්නේදැයි හඳුනාගැනීමට මෙහිදී හැකියාව ලැබේ. විශේෂයෙන්ම ළමා ලිංගික අපයෝජනයට ලක් වූ ගැහැණු ළමුන් අනෙකුත් ළමා අපයෝජනයන්ට ගොදුරු වූ ළමුන්ට සාපේක්ෂව විවිධාකාර වූ අයිතිවාසිකම් උල්ලංඝනයන්ට වැඩි වශයෙන් ලක් වන බවට වන මතවාදයන් හි සත්‍ය අසත්‍යතාවය පරීක්ෂා කර බැලීම හා ලිංගික අපයෝජනයට ගොදුරුවීම හේතුවෙන් ආයතනගත රැකවරණයට යොමුවන ගැහැණු ළමුන්ගේ සංඛ්‍යාව තවදුරටත් අවම කරමින්, අයිතිවාසිකම් පදනම් කරගත් සමාජ වැඩ ප්‍රවේශය ශ්‍රී ලාංකීය සමාජයේ ප්‍රවර්ධනයට දායකත්වය සැපයීම අරමුණු කරගනිමින් මෙම පර්යේෂණය සිදු කිරීම හේතුවෙන් කාලීන වශයෙන් මෙය ඉතා වැදගත් පර්යේෂණයකි.

ළමා ලිංගික අපයෝජනය වඩාත් බරපතල ලෙස බලපානු ලබන්නේ ගැහැණු දරුවන් කෙරෙහිය. ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වන ගැහැණු ළමුන් ඒ හේතුවෙන් ලබන කටුක අමිහිරි අත්දැකීම් පසුකාලීනව ඔවුන්ගේ ජීවිත කෙරෙහි තීරණාත්මක බලපෑමක් එල්ල කරනු ලබයි. ළමා ලිංගික අපයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස ඒ සඳහා ගොදුරුවන ගැහැණු දරුවන් බොහෝ දුරට ආයතනගත කිරීම සිදුකරන නමුත් ආයතනගත පුනරුත්ථාපනය තුළ ඇති ගැටලු සහගත ස්වභාවය හේතුවෙන් ආයතනගත පුනරුත්ථාපනය මගින් ඔවුන්ගේ උපරිම යහපත නොවන බවට විවේචන තිබේ. එබැවින් ආයතනගත පුනරුත්ථාපනයට වඩා ප්‍රජාපාදක පුනුරුත්ථාපනය එම ගැහැණු දරුවන්ගේ උපරිම යහපත කෙරෙහි ඵලදායී වන බව නූතනයේදී හඳුනාගෙන තිබේ. ආයතනගත ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කිරීමේ දී ඔවුන් නැවත සමාජ ගත කිරීම අතිශය වැදගත් කාරණයකි. එහිදී පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ විකල්ප රැකවරණය නිසි ආකාරයෙන් සිදුවේද යන්න සොයා බැලීම වැදගත් වේ. විකල්ප රැකවරණය යටතේ පසුවන බොහෝ දරුවන් ඔවුන්ගේ භාරකරුවන්ට එසේත් නැතහොත්

සුදුසු පුද්ගලයින්ට අධිකරණ නියෝග මත ලබා දී ඇතත් ඉන් පසු ඔවුන්ගේ උපරිම යහපත සැලසී ඇද්ද යන්න විදධිමත් ආකාරයට සොයාබැලීමට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරන්නේද යන්න විමසා බැලීම කාලෝචිත ක්‍රියාමාර්ගයකි. විශේෂයෙන්ම පසුගිය වසර කීපයක් මුළුල්ලේ ආයතනගත රැකවරණයට වඩා ප්‍රජාපාදක රැකවරණයට නැඹුරු වූ පසුබිමක් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂයේ සිට 2020 දක්වා වූ වසර 6ක කාලසීමාව තුළ සංඛ්‍යා දත්ත පරිශීලනයේදී හඳුනාගත හැකිය. එහිදී පෙනී යන්නේ ක්‍රමානුකූලව ආයතනගත ළමුන් සංඛ්‍යාව අඩුවෙමින් පවතින බවයි.

**වගු අංක 1. ශ්‍රී ලංකාවේ ආයතනගත ළමුන් පිළිබඳ සංඛ්‍යා දත්ත (2013 සිට 2020 දක්වා)**

| වර්ෂය | ආයතන සංඛ්‍යාව | ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| 2013 | 417 | 14555 |
| 2014 | 391 | 14576 |
| 2015 | 394 | 13995 |
| 2016 | 387 | 13691 |
| 2017 | 405 | 12974 |
| 2018 | 374 | 11132 |
| 2019 | 379 | 10632 |
| 2020 | 379 | 10748 |

(මූලාශ්‍රය - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යා දත්ත, 2013-2020)

උක්ත වර්ෂයන්ට අදාළව ශ්‍රී ලංකාව තුළ ආයතනගත වූ සියළුම ළමුන්ගේ තොරතුරු ඉහත වගුවේ දැක්වෙන අතර එම ළමුන් අතරින් ලිංගික අපයෝජනයන්ට ගොදුරු වූ ළමුන් ද හඳුනාගත හැකිය.

ළමා අපයෝජනයට මෙන්ම අයිතිවාසිකම් උල්ලංඝනයන්ට ලක්වන ළමුන් සඳහා ආයතනගත ළමා රැකවරණය මෙන්ම විකල්ප ළමා රැකවරණය ද නූතන ලෝකයේ භාවිතා වේ. මින් වඩාත් වැදගත් වන්නේ විකල්ප ළමා රැකවරණයයි. විකල්ප ළමා රැකවරණය යටතේ ළමයින් තමන්ගේ පවුල් පරිසරය හා ප්‍රජාව තුළ සිටියදීම සංවර්ධනය කිරීම සඳහා උත්සහ ගනී. විකල්ප ළමා රැකවරණයේ තීරණාත්මක සාධකය ළමයා ජීවත්වන පවුල හා ප්‍රජාවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය (2010) හඳුන්වා දෙන ලද විකල්ප මාර්ගෝපදේශ මාලාවේ සඳහන් වන පරිදි ළමයෙකු තම නේවාසික පරිසරයෙන් ඉවත් කොට ආයතන ගතකිරීම සිදු කරන්නේ නම් එය අවසන් විකල්පය වශයෙන් කළයුතු බවයි. එසේ ආයතනගත කළද එය ඉතාමත් කෙටිකාලීනව සිදුකොට ළමයා නැවත පවුල හෝ ප්‍රජාව වෙතට යොමු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු බව එහි සඳහන් වේ. එක්සත්ජාතීන්ගේ සංවිධානය හඳුන්වාදුන් මාර්ගෝපදේශ අනුව ශ්‍රී ලංකාවේ විකල්ප රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2019) දී සම්පාදනය කර ඇති අතර එහි

සදහන් පරිදි විකල්ප රැකවරණය යනු, "අධිකරණය හෝ එවැනි බලයක් ලබා දී ඇති ආයතනයක් මගින් දෙනු ලැබූ තීරණයක් මත හෝ දරුවා ගේ, දෙමාපියන්/ භාරකරුවන් ගේ හෝ දෙමාපියන් නොමැති අවස්ථාවක රැකවරණ සපයන්නෙකු ගේ මූලික වීමෙන්, දෙමාපිය සෙවනින් පරිභාහිරව දරුවකුහට විධිමත් හෝ අවිධිමත් රැකවරණ සැලසීමක් වේ". ඒ අනුව 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විකල්ප රැකවරණයට යොමු කොට ඇති ළමුන් සංඛ්‍යාව පහත පරිදි හඳුනාගත හැකිය.

**වගු අංක 1.2** අධිකරණය මගින් සෘජුව විකල්ප ක්‍රමවලට යොමුකරනු ලබන වින්දිත ළමුන් සංඛ්‍යාව (**2020**)

| **ආයතනගත කිරීමට අමතරව ඇති විකල්පයන්** | **ගැහැණු ළමුන් සංඛ්‍යාව** | **පිරිමි ළමුන් සංඛ්‍යාව** | **එකතුව** |
|---|---|---|---|
| සුදුසු පුද්ගලයෙකු වෙත භාරදීම | 754 | 519 | 1273 |
| සහතික කළ පාසලකට හෝ වෙනත් ආයතනයකට යොමු කිරීම | 299 | 182 | 481 |
| දෙමාපියන්ට භාරදීම | 1175 | 616 | 1791 |
| පරිවාස නිලධාරීන් විසින් අධීක්ෂණය | 1072 | 679 | 1751 |
| වෙනත් | 70 | 62 | 132 |
| **එකතුව** | **3370** | **2058** | **5428** |

(මූලාශ්‍රය - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යා දත්ත, 2020)

විකල්ප රැකවරණයට යොමු කොට ඇති ළමුන් අතරින් සමාජය තුළ අයිතිවාසිකම් උල්ලංඝනයන්ට බහුලව මුහුණ දෙනු ලබන්නේ ලිංගික අපයෝජනයන්ට ගොදුරු වන ගැහැණු ළමුන්ය. එබැවින් මෙහිදී ඔවුන්ගේ උපරිම යහපත උදෙසා සමාජ වැඩ මැදිහත්කරණයේ අවශ්‍යතාවය පිළිබඳව හඳුනාගැනීමට උත්සාහ ගනු ලැබේ.

**පර්යේෂණ ගැටලුව**

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත නිසියාකාරව සිදුවන්නේද ?

**පර්යේෂණයේ අරමුණු**

**ප්‍රධාන අරමුණ**

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණය යටතේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා සමාජ වැඩ මැදිහත්කරණයේ අවශ්‍යතාවය හඳුනාගැනීම

## සුවිශේෂී අරමුණු

1. එම ගැහැණු ළමුන්ගේ සමාජ ආර්ථික පසුබිම හඳුනාගැනීම
2. වර්තමානයේදී ඔවුන්ගේ උපරිම යහපත නිසියාකාරව සිදුවේදැයි විමසා බැලීම
3. උපරිම යහපත සඳහා ක්‍රියාකිරීමේ දී පවතින අභියෝග හා බාධක පිළිබඳ සොයා බැලීම
4. ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණය යටතේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා වඩාත් හිතකර සමාජ වැඩ ක්‍රමෝපායන් හඳුනාගැනීම

## අධ්‍යයන ක්‍රමවේදය

### නියැදිය

මෙම පර්යේෂණය සඳහා සසම්භාවීනොවන නියැදිය යටතේ පරමාර්ථානුගත නියැදිය භාවිතා කරන ලදි. පරමාර්ථානුගත නියැදිය යටතේ ප්‍රතිචාරකයන් 10 තෝරා ගත් අතර ඔවුන් තොරා ගැනීමේදි නිකවැරටිය හා ආණමඩුව පරිවාස කාර්යාල වල අධිකරණ වාර්තා ලේඛනයෙහි ලියාපදිංචි ලිංගික අපයෝජනයට ගොදුරු වී දැනට විකල්ප රැකවරණයේ පසුවන පරිවාස නිලධාරී අධීක්ෂණයක් සහිත ගැහැණු ළමුන් 10 දෙනෙකු තොරා ගෙන තිබේ. එහිදි නිකවැරටිය පරිවාස කාර්යාලයේ අධීක්ෂණය යටතේ පසුවන ගැහැණු ළමුන් 05 දෙනෙකු හා ආණමඩුව පරිවාස කාර්යාලයේ අධීක්ෂණය යටතේ පසුවන ගැහැණු ළමුන් 05 දෙනෙකු නියැදියට යොදා ගන්නා ලදි.

### දත්ත රැස්කිරීමේ ක්‍රමශිල්ප

මෙම පර්යේෂණයෙහි දත්ත රැස්කිරීමේදී මූලික දත්ත හා ද්වීතීයික දත්ත රැස් කරගනු ලැබීය. මූලික දත්ත ලබා ගැනීමේදී සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා සහභාගී නොවන නිරීක්ෂණය උපයෝගී කරගන්නා ලද අතර ද්විතීයික දත්ත රැස්කිරීමේදී ළමා ලිංගික අපයෝජනය,විකල්ප රැකවරණය, ළමා අයිතිවාසිකම් හා ළමා සුභසාධනයට අදාළ පොත් පත්, වාර සඟරා හා ලිපි ලේඛන හා අන්තර්ජාල මූලාශ්‍ර භාවිතා කරන ලදී. මෙහිදී විශේෂයෙන්ම නිකවැරටිය හා ආණමඩුව පරිවාස කාර්යාලයන්හි අධිකරණ වාර්තා ලේඛනය හා වින්දිත ගැහැණු ළමුන්ගේ ලිපි ගොනු පරිශීලනය කිරීම මගින් අධ්‍යයනයට අදාළ වැදගත් ද්විතීයික දත්ත රාශියක් ලබා ගන්නා ලදී.

මූලික දත්ත රැස්කිරීමේදී එය පහත පරිදි සිදු විය.

### 1.ප්‍රත්‍යයක අධ්‍යයන විධික්‍රමය

මේ යටතේ නිකවැරටිය ලිංගික අපයෝජනයට ලක්ව විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන් 10 දෙනාගෙන් හා ඔවුන්ගේ භාරකරුවන්ගෙන් දත්ත ලබා ගන්නා ලදී.

**2.නියමු සම්මුඛ සාකච්ඡා**

මේ යටතේ නිකවැරටිය පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිළධාරී හා පරිවාස නිලධාරීන් දෙදෙනෙකු හා ආණමඩුව පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිලධාරී හා පරිවාස නිලධාරිණියක් ලෙස ස්ථානභාර පරිවාස නිලධාරීන් හා පරිවාස නිලධාරීන් 05 ගෙන් තොරතුරු ලබා ගන්නා ලදි. නියමු තොරතුරු කෙරෙහි අවධානය යොමු කිරීමෙදි උක්ත ළමුන් සමග සෘජුවම වැඩ කටයුතු කරන සහ ඔවුන් අධීක්ෂණය කරන නිලධාරීන් යොදා ගැනීම මගින් ඔවුන්ගේ අත්දැකීම් හා අදාල සිද්ධීන් සඳහා ඔවුන් ගත් ක්‍රියා මාර්ග පිළිබඳ මෙන්ම ළමුන් සමග කටයුතු කිරීමේදි ඔවුන් මුහුණ දුන් අභියෝග හා ඔවුන්ගේ අදහස් යෝජනා පාදක කර ගනිමින් විකල්ප රැකවරණය තුළ ලාංකීය සාමාජයට අවැසි සුදුසු ක්‍රම වේදයක් සකස් කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශය ලබා ගැනීම සිදුවිය. එය පර්යේෂණයේ සමාජ වැඩ මැදිහත්වීමේ ශිල්පීය ක්‍රමෝපායන් නැවත සකස් කිරීමට මෙන්ම යාවත්කාලීන කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශය ලබාදීම සිදු විය.

**දත්ත විශ්ලේෂණය**

මෙහි දත්ත විශ්ලේෂණය තේමා විශ්ලේෂණයක් (Thematic analysis) ලෙස සිදු කරන ලදි. එහිදි ලබා ගන්නා ලද දත්ත වගු සටහන්, රූප සටහන් හා ගැලීම් සටහන් සටහන් මගින් ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.

**තෝරාගත් මූලික තේමා**

1. ප්‍රතිචාරකයින්ගේ පසුබිම
2. ප්‍රතිචාරකයින්ගේ උපරිම යහපත
3. උපරිම යහපත සඳහා ඇති සීමා හා බාධක
4. සමාජ වැඩ මැදිහත්කරණයෙහි අවශ්‍යතාවය

ප්‍රධාන තේමා යටතේ උප තේමා අටක් හඳුනා ගත හැකි අතර එය මෙසේ දක්වා ඇත.

| | **තේමා** | **ප්‍රවර්ග** |
|---|---|---|
| 01 | ප්‍රතිචාරකයින්ගේ පසුබිම | මූලික තොරතුරු<br>සමාජ හා සංස්කෘතික පසුබිම<br>ආර්ථික පසුබිම<br>නෛතික පසුබිම |
| 02 | ප්‍රතිචාරකයින්ගේ උපරිම යහපත | ආරක්ෂාව<br>සංවර්ධනය<br>යහපැවැත්ම<br>සුභසාධනය<br>පුනරුත්ථාපනය |
| 03 | උපරිම යහපත සඳහා ඇති සීමා හා බාධක | සුභසාධන සේවාවන් විධිමත්ව නොලැබීම<br>නොදැනුවත්භාවය<br>භාරකරුවන්ගේ දරිද්‍රතාව<br>පරිවාස නිලධාරී අධීක්ෂණයෙහි ගැටළු<br>ලේබල්කරණය |

| | | |
|---|---|---|
| | | සමාජ සහය නොලැබීම<br>ජාතික ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීම<br>ළමා අයිතිවාසිකම් පිළිබඳ ළමාරක්ෂණ නිලධාරීන්ගේ අඩුසැළකිල්ල<br>ළමුන්ගේ සමාජානුයෝජනයෙහි ගැටළු<br>විධිමත් නියාමනයක් නොමැතිකම |
| 04 | සමාජ වැඩ මැදිහත්කරණයෙහි අවශ්‍යතාවය | ක්ෂුද්‍ර මට්ටමේ මැදිහත්වීම<br>මධ්‍ය මට්ටමේ මැදිහත්වීම<br>සාර්ව මට්ටමේ මැදිහත්වීම |

**(මූලාශ්‍රය- ක්ෂේත්‍ර දත්ත, 2022)**

**අධ්‍යයන අනාවරණයන්**

**ප්‍රතිචාරකයින්ගේ මූලික තොරතුරු**

මෙම අධ්‍යයනය සඳහා සහභාගී වූ ප්‍රතිචාරකයින්ගේ මූලික තොරතුරු පහත පරිදි හඳුනාගත හැකිය.

**වගු අංක 4.1. ප්‍රතිචාරකයින්ගේ මූලික තොරතුරු**

| **ප්‍රතිචාරකයින්ගේ මනඃකල්පිත නම** | **වයස (අවුරුදු)** | **ආගම** | **අධ්‍යාපන මට්ටම** |
|---|---|---|---|
| 1. ටානියා | 17 | බෞද්ධ | 09 ශ්‍රේණිය දක්වා |
| 2. නිමාලි | 15 | බෞද්ධ | 09 ශ්‍රේණිය දක්වා |
| 3.සඳලි | 16 | බෞද්ධ | 11 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබයි |
| 4.විනුදි | 16 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |
| 5.නෙත්මි | 17 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |
| 6.සුපුනි | 17 | කතෝලික | 08 ශ්‍රේණිය දක්වා |
| 7.නදී | 16 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |
| 8.නිම්නා | 16 | බෞද්ධ | 09 ශ්‍රේණිය දක්වා |
| 9.චේතනා | 17 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |
| 10.සනුලි | 15 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |

(මූලාශ්‍රය :- ක්ෂේත්‍ර දත්ත, 2022)

ඉහත වගුව ඇසුරින් ප්‍රතිචාරකයින්ගේ වයස් ව්‍යුහය හා අධ්‍යාපන මට්ටම පිළිබඳව මූලික තොරතුරු හඳුනාගත හැකිය.

මෙම අධ්‍යයනයෙහි දත්ත දායකයින්ගේ වයස් ව්‍යුහය පිළිබඳව සැලකීමේදී වයස අවුරුදු 12 සිට වයස අවුරුදු 17 දක්වා පරාසයක විහිදී යයි. ඒ අනුව මෙම දත්ත දායකයින් සියළුම දෙනා නව යොවුන්වියේ පසුවේ.

**අධ්‍යාපන පසුබිම**

අධ්‍යයනයට ලක් වූ ප්‍රතිචාරකයින්ගේ අධ්‍යාපන පසුබිම පිළිබඳ හඳුනා ගැනීමේදී එය පහත පරිදි විය.
1. ප්‍රතිචාරකයින් පස්දෙනෙකු 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇත
2. ප්‍රතිචාරකයින් තුන්දෙනෙකු 9 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇත
3. ප්‍රතිචාරකයින් එක් අයෙකු 8 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇත
4. ප්‍රතිචාරකයින් එක් අයෙකු මේ වන විටත් පාසල් අධ්‍යාපනය ලබයි

(මූලාශ්‍රය- ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2022)

මෙහිදී හඳුනාගත හැකි වූ සුවිශේෂී කාරණය වන්නේ ලිංගික අවයව ප්‍රදර්ශනය කිරීමෙන් අපයෝජනයට ලක්වූ සදලි දැරිය හැර අනෙකුත් සියළුම ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනය වර්තමානයේදී බිඳ වැටී ඇති බවයි. ඒ සඳහා හේතු සාධක රාශියක් බලපා තිබේ.

*"මම 09 ශ්‍රේණියේ ඉගෙන ගන්නකොට තමයි ඔය සිදුවීමට මුහුණ දුන්නේ. පුතාව ලැබුණට පස්සේ අධ්‍යාපනයක් ගැන හිතුවෙ නෑ. මට ඕනෑ වූනේ කොහොමහරි පුතාව හදා ගන්න. දැනුත් ඉගෙන ගන්න හිතක් මට නෑ."* (නිම්නා, ප්‍රත්‍යයක අධ්‍යයන 08, 22/02/2022)

නිම්නා දැරිය 09 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන විට තරුණයෙකු හා ඇති කරගන්නා ලද ප්‍රේම සම්බන්ධතාවයක ප්‍රතිඵලයක් ලෙසින් එම තරුණයා සමග නිවසින් පලාගොස් අඹුසැමියන් ලෙස ජීවත් වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඇයට පුතෙකු බිහිවී තිබේ. එම හේතු සාධකය නිසා ඇයගේ පාසල් ගමන එම සිදුවීමෙන් පසු අඩාල වී තිබේ.

නෙත්මි දැරියද තමන් මුහුණ පෑ ලිංගික අපයෝජනයෙන් අනතුරුව අධ්‍යාපනය අතරමග නවතා දමා ඇති දැරියකි.

*"ඒ සිද්ධියෙන් පස්සේ මාව අපේ ඉස්කෝලෙට ආයෙ ගන්න බෑ කිව්වා. මටත් අපේ ඉස්කෝලෙට යන්න ගොඩක් ලැජ්ජා හිතුණා. ඒක නිසා මම ආපසු ඉස්කෝලෙ ගියේ නෑ. මම ලබන මාසේ සවුදියට යන්න හිතාගෙන ඉන්නෙ තාත්තා මාව එහෙට ගන්න අවශ්‍ය වැඩකටයුතු සියල්ල ඉවර කරල තියෙන්නෙ"* (නෙත්මි, ප්‍රත්‍යයක අධ්‍යයන 05, 22/02/2022)

නෙත්මි දැරිය අදාළ ලිංගික අපයෝජනයට ගොදුරු වී ඇත්තේ වයස අවුරුදු 15 දී පමණය. මේ වන විට ඇයගේ වයස අවුරුදු 17 කි. වයස 2 කට ආසන්න කාලයක් පාසල් අධ්‍යාපනය අඩාල වී තිබේ.

සමාජයක් තුළ සාරධර්ම ජනනය කිරීමටත් ඒවා ව්‍යාප්ත කිරීමට මෙන්ම සමාජය තුළ දැනුම වර්ධනය කිරීමට ද අධ්‍යාපනය අවශ්‍යය වේ. සමාජ විද්‍යාඥයන් පවසන පරිදි සමාජානුයෝජනයේ විධිමත් නියෝජිතයා වන්නේ පාසලයි. ඇමරිකන් සමාජ විද්‍යාඥ ටැල්කොට් පාර්සන්ස් වරක් පෙන්වා දී ඇති පරිදි අධ්‍යාපනය මගින් පවුලේ සිදුවන සමාජානුයෝජනයට ඌන පුරණයක් ලබා දෙයි. (පෙරේරා, 2002 පි:52) ඒ අනුව අධ්‍යාපනයෙන් බැහැර වීම හෝ නිසි අධ්‍යාපනයක් නොලැබී යාම ළමයාගේ නිසි

සමාජානුයෝජනයට බලපෑමක් එල්ල කරයි. ඒ තුළ ළමයා සතු සමාජීය දැනුම මෙන්ම විධිමත් ලිංගික අධ්‍යාපනය සහ විෂයාබෝධය ලබාගත නොහැකි වී තිබේ. එසේම පාසල් ගමන අතරමග නතරවීම ඔවුන් එකී දැනුමින් බැහැර කොට දුස්සමාජානුයෝජනයක් ඇතිකරලිමට හෝ ඔවුන් හුදකලා කිරීමට හෝ හේතුවන අතර එය ඔවුන් ලිංගික අපයෝජකයන්ගේ ගොදුරු බවට පත්වීමට ඉඩ සලසන්නක් වෙයි.

මෙම දත්තදායකයන් ලබාදුන් දත්ත ඇසුරින් පෙනී යන්නේ ලිංගික අපයෝජනයකට ලක්වීමෙන් පසුව ඇතිවූ සමාජීය බලපෑම් හේතුවෙන් බොහෝ ළමුන්ගේ පාසල් අධ්‍යාපනය අඩාලවී ඇති බවයි. ඒ අනුව

1 පාසල් බලධාරීන් විසින් මෙම ළමුන් නැවත පාසලට ගැනීමට අප්‍රසාදය පළ කිරීම
2 සමාජය තුළ මොවුන් අපවාදයට ලක්වීම
3 සමාජයට මුහුණදීමට ඇති අපහසුව

යන ප්‍රධාන කාරණා ළමුන්ගේ පාසල් අධ්‍යාපනය බිඳවැටීමෙහිලා බලපෑ සමාජීය සාධකය. මේ අතරින් සමාජය තුළ මොවුන් අපවාදයට ලක්වීම නැවත පාසල්ගත වීම වැළැක්වීමෙහිලා බලපා ඇති ප්‍රධාන හේතු සාධකයකි.

**පවුල් පසුබිම**

මෙම අධ්‍යයනයට සහභාගී වූ දත්ත දායකයින්ගෙන් බහුතරයක් බිඳුණු පවුල් පසුබිමකින් යුක්ත වේ. ළමා සංවර්ධනයේදී පවුල ප්‍රධාන සාධකයක් ලෙස පිළිගැනෙන නමුත් මෙහි දත්ත දායකයින්ගෙන් බහුතරයක් බිඳුණු පවුල් පසුබිමකින් යුක්ත වීමෙන් බොහෝ ගැහැණු දරුවන් නව යොවුන් වියේදී ලිංගික අපයෝජනයන්ට ගොදුරු වී ඇති බව මෙහිදී අනාවරණය වී තිබේ. බිඳුණු පවුල් (Broken Families) පසුබිම තුළ දෙමාපියන් හා දරුවන් විභේදනයට ලක්වීම නිසා දරුවන්ට දැඩි අනාරක්ෂිතභාවයට පත්වේ. මෙවන් පසුබිමක් මත ගැහැණු ළමයකු පවුල තුළදී මෙන්ම සමාජය තුළදී ලිංගික අපයෝජනයට ගොදුරුවීමේ සම්භාවිතාවය ඉහළ මට්ටමක පවතී. මෙම අධ්‍යයනයෙහි ප්‍රතිචාරකයින්ගේ පවුල් පසුබිම පිළිබඳව අවධානය යොමු කිරීමේදී එම කාරණය තහවුරු වේ. එසේම පවුලේ සාමාජිකයන්ගේ සබඳතාවල ගැටළු සහගත ස්වභාවය, ගෘහ මූලිකයාගේ ගැටළු සහගත ස්වභාවය හා නොදැනුවත්භාවය ඔවුන් මෙසේ අඩු වයසින් ලිංගික අපයෝජනයට ලක්වීම කෙරෙහි බලපා ඇති බව හඳුනාගත හැකිය.

බොන්ෆෙන් බ්‍රෙනර්ගේ පාරිසරික පද්ධති න්‍යායෙහි දැක්වෙන පරිදි ළමා සංවර්ධනයේදී වැදගත් වන ප්‍රධාන පද්ධති 05 කි. ඉන් ක්ෂුද්‍ර පද්ධතිය, මධ්‍ය පද්ධතිය හා මහා පද්ධතිය ළමා සංවර්ධනය කෙරෙහි තීරණාත්මකව බලපායි. මෙහි අධ්‍යයනයට ලක්වූ ගැහැණු ළමුන් පිළිබඳව සැලකිලිමත්වීමේ පෙනී යන්නේ ළමා සංවර්ධනය සම්බන්ධයෙන් බොන්ෆෙන් බ්‍රෙනර් ඉදිරිපත් කරන ලද පාරිසරික පද්ධති න්‍යායෙහි සඳහන් බොහෝ කාරණා සමග සබඳතාවයක් මෙම අධ්‍යයනයේ දත්ත දායකයින්ගේ සමාජ පසුබිම තුළින් හඳුනාගත හැකි බවයි.

**ආර්ථික පසුබිම**

මෙම අධ්‍යයනයෙහි දත්තදායකයින්ගේ ආථික පසුබිම පිළිබඳව අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ ගැහැණු ළමුන් 8 ක් ග්‍රාමීය අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් බවයි. ඉන් 5 ක් සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන්ට අයත් වේ. 3 ක් සමෘද්ධි ප්‍රතිලාභීන් නොවන නමුත් සමෘද්ධි ප්‍රතිලාභ ලැබිය යුතු තත්ත්වයේ පවතින බව පෙනේ. 2 ක් ආර්ථික මට්ටම යහපත් තත්ත්වයක පවතින බව හඳුනා ගත හැකිය.

*"මගේ දරුවාට දැන් වයස අවුරුදු 01ක් වෙනවා. දරුවාට කිරිපිටි අරන් දෙන්න ඇඳුම් අරන් දෙන්න මට මුදල් ඕන. නැන්දට හැමවෙලේම කරදර කරන්න බැරි නිසා මම කුලී වැඩට යනවා. දවසට මට රුපියල් 500ත් ගෙවනවා. ඒකෙන් තමයි දරුවට කිරිපිටි කිරි අරන් දෙන්නෙ. ඒත් හැමදාමත් එක දිගට තුලි වැඩ කරන්න අමාරුයි."* (නිම්නා, ප්‍රත්‍යයක අධ්‍යයන 8, 21/02/2022)

වයස අවුරුදු 15දී පත්වූ නිම්නා දූරිය සිය දරුවා නඩත්තු කිරීම සඳහා කුළී වැඩ කිරීමට ගොස් ඇති බව මෙහිදී ප්‍රකාශ කොට තිබේ.

**නෛතික පසුබිම**

මේ යටතේ ප්‍රතිචාරකයින් ගොදුරු වී ඇති ලිංගික අපයෝජනයෙහි ස්වභාවය හා විකල්ප රැකවරණයේ ස්වභාවය පිළිබදව සාකච්ඡා කරනු ලැබේ.

**ලිංගික අපයෝජනයේ ස්වභාවය**

මෙම පර්යේෂණයෙහි දත්තදායකයින්ගේ පසුබිම හඳුනාගැනීමේදී ඔවුන් ගොදුරු වූ ලිංගික අපයෝජනයේ ස්වභාවය පිළිබදව විශේෂ අවධානයක් යොමු කිරීමට සිදුවේ. ඒ අනුව ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් ළමා ලිංගික අපයෝජනයට අදාළ වැරදි අතරින් පහත සඳහන් වැරදි සඳහා ප්‍රතිචාරකයින් ගොදුරු වී තිබේ.

**වගු අංක 4. 6. ලිංගික අපයෝජනයේ ස්වභාවය**

| අනු අංකය | වරද | ගොදුරු වූ ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ස්ත්‍රී දූෂණය (ද.නී.ස. 363 වගන්තිය) | 02 |
| 2 | නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය හා ස්ත්‍රී දූෂණය | 05 |
| 3 | ලිංගික අතවර | 01 |
| 4 | ලිංගික අවයව ප්‍රදර්ශනය කිරීම | 01 |
| 5 | ස්ත්‍රී දූෂණය හා අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 01 |
| | **එකතුව** | **10** |

(මූලාශ්‍රය ක්ෂේත්‍ර දත්ත 2022)

ඒ අනුව ප්‍රතිචාරකයින්ගෙන් 8 ක් ස්ත්‍රී දූෂණය වරද සඳහා ගොදුරු වී ඇති අතර ඉන් තිදෙනෙකු ළමා මව්වරුන් බවට පත්වී තිබේ. ගැහැණු ළමුන්ට එරෙහිව කරනු ලබන ලිංගික අපයෝජන අතරින් බරපතලම අපයෝජනය වන්නේ ස්ත්‍රී දූෂණයයි. ස්ත්‍රී දූෂණයට ගොදුරු වන ළමුන් තුළ පසුකාලීනව විවිධාකාර වූ මානසික හා කායික ආබාධ

ඇතිවීමේ ප්‍රබල අවදානමක් පවතින බැවින් ඔවුන්ගේ උපරිම යහපත උදෙසා කටයුතු කිරීමේදී ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමුකිරීම අත්‍යාවශ්‍ය වේ.

බොහෝ ගැහැණු ළමුන් ලිංගික අපයෝජන සඳහා ගොදුරු කරගනු ලබන්නේ තමා කෙරෙහි වගකීමක්, විශ්වාසයක්, බලයක් දරන පුද්ගලයන් විසිනි. මෙම අධ්‍යයනයෙහි ප්‍රතිචාරකයින් අතුරින් 7 ක් ප්‍රේම සබඳතා මත ඇතිවූ විශ්වාසය මත පදනම්ව ලිංගික අපයෝජනයට ගොදුරු වී ඇත. 1 ක් වගකීම, විශ්වාසය හා බලය සහ ඥාතීත්වය මත පදනම්ව ලිංගික අපයෝජනය සඳහා ගොදුරු වී තිබේ. 2 ක් ආගන්තුකයින් වන පුද්ගලයින්ගේ බලය මත පදනම්ව ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ.

මෙම අධ්‍යයනයට සහභාගී වූ ප්‍රතිචාරකයින් ලිංගික අපයෝජනයට ගොදුරුවීමෙහිලා බලපා ඇති හේතු සාධක ලෙස පහත සඳහන් හේතු සාධක හඳුනාගත හැකිය.

01. බිඳුණු පවුල් පසුබිම
02. ළමයින්ගේ නොදැනුවත්භාවය
03. අඩු වයසින් ප්‍රේම සබඳතා සඳහා පෙළඹීම
04. අනාරක්ෂිත පරිසරය
05. අයහපත් සමාජානුයෝජනය
06. ජංගම දුරකථන භාවිතය
07. ලිංගික අධ්‍යාපනය විධිමත්ව නොලැබීම
08. පුද්ගල බද්ධ සාධක (සමාජ විරෝධී පෞරුෂ ලක්ෂණ)
09. මවගේ ආදරය, රැකවරණය නොමැති වීම
10. නව යොවුන් වියේ අවශ්‍යතා ඉටුනොවීම
11. ආර්ථික අපහසුතා
12. ළමා අයිතිවාසිකම් පිළිබඳ වැඩිහිටියන්ගේ අනවබෝධය

(ක්ෂේත්‍ර දත්ත, 2022)

**විකල්ප රැකවරණයේ ස්වභාවය**

ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය (2019) සඳහන් වන පරිදි දරුවෙකු හට විකල්ප රැකවරණ සේවා සැපයීමට ප්‍රථමයෙන් එම දරුවා සිය දෙමාපිය සෙවනෙහිම රඳවා තැබීම සඳහා ගත හැකි අනෙකුත් සියලු විසඳුම් සලකා බැලෙන බව තහවුරු කෙරෙන්නා වූ ශක්තිමත් ද්වාර පාලන යාන්ත්‍රණයක් ඇති කිරීමට කටයුතු කිරීම වැදගත් වේ. තවදුරටත් එම ජාතික ප්‍රතිපත්තියේ සඳහන් වන්නේ දරුවෙකුගේ ස්ථානගත කිරීම සම්බන්ධ සියලු තීරණ ගැනීම් වලදී දරුවාට ඔහුගේ/ඇයගේ ශක්‍යතාවයට අනුව සහභාගී වීමට අයිතිය ඇති බව පිළිගැනීම හා දරුවෙකු හට විකල්ප රැකවරණ සැලසීමේ අවශ්‍යතාව තීරණය කිරීම සඳහා ශක්තිමත් හා පරිපූර්ණ ඇගයීමක් සිදු කිරීමේ අවශ්‍යතාවය හා බහුවිෂය කණ්ඩායම් ප්‍රවේශයක අවශ්‍යතාවයයි.

මෙම අධ්‍යනයේදී ප්‍රචාරකයින් විකල්ප රැකවරණයේ ස්වාභාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඉහත ජාතික ප්‍රතිපත්තියේ සඳහන් කරණු පිළිබඳ සැලකිලිමත් වෙමින් එය සිදු කරනු ලැබේ.ඒ අනුව ප්‍රචාරකයින්ගේ විකල්ප රැකවරණයේ ස්වභාවය පහත පරිදි වේ.

**වගු අංක 4. 7. විකල්ප රැකවරණයේ ස්වභාවය**

| **විකල්ප රැකවරණයේ ස්වභාවය** | **සංඛ්‍යාව** |
|---|---|
| දෙමාපියන් සමීපයේ | 04 |
| පියා සමීපයේ | 01 |
| මව සමීපයේ | 01 |
| සුදුසු පුද්ගලයෙකු සමීපයේ | 04 |
| **එකතුව** | **10** |

(මූලාශ්‍රය- ක්ෂේත්‍ර දත්ත, 2022)

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2017) දක්වා ඇති පරිදි විකල්ප රැකවරණය වූ කලී අධිකරණය හෝ එවැනි බලයක් ලබා දදී ඇති ආයතනයක් මගින් දෙනු ලබන තීරණයක් මත හෝ දරුවාගේ,දෙමාපියන් / භාරකරුවන්ගේ හෝ දෙමාපියන් නොමැති අවස්ථාවක රැකවරණ සපයන්නෙකුගේ මූලික විමෙන් , දෙමාපිය සෙවනෙන් පරිභාහිරව දරුවෙකු හට විධිමත් හෝ අවිධිමත් රැකවරණය සැලැසීමක් වේ. ඉහත සදහන් ප්‍රතිචාරකයන් අතරින් 06 ක් අධිකරණය දෙනු ලැබූ තීරණයක් මත හා 04ක් දෙමාපියන් නොමැති අවස්ථාවක රැකවරණ සපයන්නෙකුගේ මූලික විමෙන් විකල්ප රැකවරණයකට යොමු කොට තිබේ. එම සුදුසු පුද්ගලයින් ලෙස මිත්තණිය ප්‍රත්‍යයක අධ්‍යයන 03 ක සහ නැන්දා එක් ප්‍රත්‍යයක අධ්‍යයනයකදී හදුනා ගත හැකිය. මෙම සියලු ප්‍රතිචාරකයින් පරිවාස නිලධාරී අධීක්ෂණයක් යටතේ (පරිලෝචන සහ සුදුසු පුද්ගල පරිලෝචන) සිටින බව හඳුනා ගත හැකිය.

මෙහිදී අනාවරණය වූ වැදගත් කරණයක් වන්නේ සමහරක් ප්‍රතිචාරකයින් ඔවුන්ගේ අධිකරණ නියෝගයේ කාලසීමාව අවසන් වීමෙන් පසු පරිවාස දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන් ගිලිහී ඇති බවයි. ඒ බව ප්‍රත්‍යයක අධ්‍යයන 05 නෙත්මිගේ ප්‍රකාශනයෙන් පැහැදිලි වේ.

*"උසාවියෙන් දුන් තීන්දුව ගිය අවුරුද්දේ ජූලි මාසයේ තමයි ඉවර වුනේ. දැන් මා ගැන සොයන්න බලන්න පරිවාස නිලධාරීන් එන්නෙ නැ. දැන් ඒ අය්යත් අපේ ගෙදර නිතර එනවා යනවා."*(නෙත්මි, ප්‍රත්‍යයක අධ්‍යන 05,21.02.2021)

සුදුසු පුද්ගල පරිලෝචන නියෝගයක් යටතේ සිය මිත්තණිය වෙත භාර දී ඇති නෙත්මිගේ වයස මේ වන විට අවුරුදු 17 කි.ඇයට වයස අවුරුදු 18 සම්පූර්ණ වන්නේ 2022 වර්ෂයේ දෙසැම්බර් මස 21 වන දිනටය.එහෙත් අධිකරණය මගින් ලබා දී ඇති සුදුසු පුද්ගල පරිලෝචන නියෝගය 2021.07.22 වන දිනෙන් අවසන් වී තිබේ.එහෙත් 2021.07.22 සිට 2022.12.21 වසර 01 යි මාස 05 ක කාලසීමාව තුළ ඇය පිළිබද අධීක්ෂණය කිරීමට පරිවාස දෙපාර්තමේන්තුව කටයුතු නොකරයි. වර්තමානය වන විට මෙම සිද්ධියට අදාල ලිපිගොනුව පරිවාස කාර්යාලයෙහි අවසන් ගොනුවක් ලෙස නම් කොට තිබේ.එබැවින් වයස අවුරුදු 18 ට අඩු ලිංගික අපයෝජනයට ගොදුරු වූ ගැහැණු ළමුන්ගේ විකල්ප රැකවරණයට අදාලව ප්‍රායෝගිකව යම් ගැටළුකාරී තත්වයක් පවතින බව හදුනාගත හැකිය. මෙම දැරිය මිත්තණිය සමීපයේ ජීවත් වුවද මෙහි සැකකරු නිතර එම

නිවසට පැමිණීම හා ඔවුන් දෙදෙනාගේ සම්බන්ධය තවදුරටත් වඩාත් ශක්තිමත්ව පවතින බව මෙහිදී අනාවරණය විය.

ප්‍රතිචාරකයින් අතරින් සදලි දැරියගේ වර්තමාන වයස අවුරුදු 16 යි මාස 07 කි. ඇය ලිංගික අපයෝජනයට ගොදුරු වන විට ඇයගේ වයස අවුරුදු 12යි මාස 09 කි. 2018.04.23 දින සිට වසර 03ක පරිලෝචන නියෝගයක් අධිකරණය මගින් ලබා දී තිබේ. ඒ අනුව 2021.04.23 දින සිට මෙම දැරියගේ භාරය සහ රැකවරණය සම්බන්ධව ඇති අධිකරණ නියෝගය අවසන් වේ. ඒ අනුව පරිවාස කාර්යාලයෙන් පවත්වාගෙන යන දැරියගේ ලිපිගොනුව අවසන් ලේඛණයට ඇතුළත් කර තිබේ. නමුත් මෙම දැරියට වයස අවුරුදු 18 සම්පූර්ණ නොවීම සහ තවමත් පාසල් අධ්‍යාපනය ලැබීම යන කරුණ මත ඇයගේ යහපත උදාකර ඇයට වයස අවුරුදු 18 සම්පූර්ණ වන තුරු ඇය පිළිබඳව අධීක්ෂණයක් සිදු කිරීම ඉතා වැදගත් බව පෙනේ.

මෙහි අධ්‍යයනයට ලක් වූ නදී දැරියගේ වත්මන් වයස අවුරුදු 16 යි මාස 03 කි. ඇය පරිලෝචන නියෝගයක් යටතේ පියා වෙත අධිකරණය මගින් භාර දී තිබේ. ඇය පිළිබඳව මාස 06 ක කාලසීමාවක් සඳහා පරිවාය නිලධාරීන්ගේ අධීක්ෂණයක් පවත්වා ඇති අතර මේ වන විට එම කාලසීමාව අවසන් වී තිබේ. ඇයට තවමත් අවුරුදු 18 සම්පූර්ණ වී නොමැතිව වර්තමානය වන විට ඇය පියාගේ රැකවරණයෙන් මිදී ඇයගේ දෙවන වැඩිමහල් සොයුරියගේ නිවසේ ජීවත් වෙයි. වර්තමානයේදී ඇයගේ අධ්‍යාපනය බිද වැටී ඇත. එබැවින් ඇය විකල්ප රැකවරණයට යොමු වී සිටියද ඇයගේ සුභසාධනය පිළිබද ගැටලුකාරී තත්වයක් පවතී.

*"ගිය අවුරුද්ද අවසානයට මට අවුරුදු 16 ක් සම්පූර්ණ වුණා. පරිවාසයෙන් කිවුවා එයාලා ආයෙ මම ගැන හොයන්නෙ බලන්නෙ නෑ කියලා ඒ නිසා මට දැන් නිදහසේ ඉන්න පුළුවන්"(නදී, ප්‍රත්‍යයක අධ්‍යයන 07,21.02.2022)*

ස්ත්‍රී දූෂණ වරදට මෙන්ම අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරදට ගොදුරු වී ඇති ඇයගේ නඩුව තවමත් අධිකරණයේ විභාග වෙමින් පවතී. එසේ වුවද ළමුන් සඳහා වන ප්‍රධානතම නීතිය වන 1939 අංක 48 දරණ ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනතේ ප්‍රතිපාදන අනුව භාරය සහ රැකවරණය අවශ්‍ය ළමයින් හා යෞවනයින් සඳහා ප්‍රතිපාදන සලකා ඇත්තේ වයස අවුරුදු 16 සම්පූර්ණ වන තෙක් පමණි. ඒ අනුව මෙම දැරියගේ භාරය හා රැකවරණය පිළිබද පරිවාස නිළධාරී අධීක්ෂණය අවසන් වීම තුළ ඇයගේ විකල්ප රැකවරණය තුළින් අපේක්ෂිත අවසන් පරමාර්ථය කරා ගමන් කළ හැකිද? යන්න ප්‍රශ්ණ ගත කරුණකි.

ළමයින් තම පවුල් පරිසරයෙන් වෙන් කිරීමේ අවශ්‍යතාවය අවම කිරීම සඳහා විකල්ප රැකවරණයක් කෙරෙහි ඔවුන් යොමු කිරීම ප්‍රායෝගිකව ඉතා වැදගත් උත්සහයකි. මේ තුළින් තමාට සමීප පුද්ගලයෙකු සහ පවත්නා ශක්තිමත් භාවාත්මක බැදීම මගින් ළමයෙකුගේ මානසික පීඩනය අවම වීමට හා ප්‍රීතිමත් භාවයට හේතුවන බැවින් ළමයින් හා දෙමාපියන්, ඥාතීන්, භාරකරුවන් අතර ශක්තිමත් බැදීමක් පවත්වා ගැනීමට එය හේතු වේ. ඒ තුළ සුරක්ෂිත බව යන හැගීම ඉස්මතු කිරීමට හැකියාව ඇත.විශේෂයෙන්ම ලිංගික

අපයෝජනයට ගොදුරු වූ වින්දිත ගැහැණු ළමුන් හට විකල්ප රැකවරණය සැලසීමේදී ගැලපෙන සුදුසු රැකවරණ විසඳුමක් තෝරා ගත යුතු අතර එය එම ළමුන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ තුරු පැවැත්වීම කෙරෙහි දැඩි අවධානයක් යොමු විය යුතුය.

**ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණය යටතේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සිදුවන ආකාරය**

ගැහැණු ළමුන්ට එරෙහිව සිදුකරනු ලබන අපරාධ අතරින් වඩාත්ම බිහිසුණු අපරාධ වන්නේ ලිංගික අපයෝජනයන්ය. ලිංගික අපයෝජන මගින් ඇති කරනු ලබන මානසික කම්පන හා චිත්තවේගී වේදනාව, එයින් ඇති කරන ශාරීරික පීඩාව හා වේදනාවට සමාන වේ. ලිංගික අපයෝජනවල ප්‍රතිඵල ඔවුන්ගේ ඉදිරි ජීවිත කාලය තුළදී නින්දාවක් හා අපවාදයක් ඉතිරි කරන අතර තමාගේ ළඟම ඥාතීන්, හිතවතුන් මෙන්ම සමාජයේ පුද්ගලයන් විසින් සිදුකරනු ලබන වෙනස්කොට සැලකීම්, හෙළා දැකීම් සහ කොන්කිරීම් හේතුවෙන් නැවත නැවතත් වින්දිතභාවයට පත්වීමට ඇති අවස්ථාවන් තිබේ. මෙහිදී උත්සාහ ගනු ලබන්නේ ප්‍රතිචාරකයින්ගේ උපරිම යහපත වර්තමානයේදී කවරාකාරයෙන් පවතීද යන්න සොයා බැලීමයි. මෙහිදී ආරක්ෂාව, සංවර්ධනය, යහපැවැත්ම, සුභසාධනය හා පුනරුත්ථාපනය යන තේමාවන් ඔස්සේ දත්ත විශ්ලේෂණය කරනු ලැබේ.

**ආරක්ෂාව**

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයට යොමු කොට ඇති ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා හේතුවන ප්‍රධානතම කාරණය වන්නේ විකල්ප රැකවරණයෙහි පවතින ආරක්ෂාවයි. ඒබ්‍රහම් මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියෙහි සඳහන් ආරක්ෂණ අවශ්‍යතා ලිංගික අපයෝජනයට ගොදුරු වූ දරුවන්ට විශේෂයෙන්ම අදාළ වේ. ඒ අනුව වර්තමානයේ විකල්ප රැකවරණය තුළ පවතින ආරක්ෂාව ඔවුන්ගේ උපරිම යහපත කෙරෙහි තීරණාත්මක බලපෑමක් එල්ල කරනු ලබයි. අධ්‍යයනයට ලක්වූ ප්‍රතිචාරකයන් දැක්වූ ප්‍රතිචාර මගින් ඔවුන්ගේ විකල්ප රැකවරණයේ සුරක්ෂිතතාවය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

*"මට නැන්දත් එක්ක තවදුරටත් මේ ගෙදර ඉන්ඩ බෑ. මාවයි දරුවයි කොහේ හරි ආයතනයකට ගිහින් දාන්න කියලා මම පරිවාස මිස්ට කියනවා. නැන්දගෙ වැඩේ හැම වෙලේම මගේ වැරදි අඩුපාඩු හොයන එක. එයා මගේ පැත්තට වඩා අරයගේ පැත්තට තමයි කතා කරන්නේ"* (නිම්නා, ප්‍රත්‍යයක අධ්‍යයන 09, 22/02/2022)

නිම්නා දැරියගේ ප්‍රකාශය බරපතල ප්‍රකාශයකි. වර්තමාන ලෝකය තුළ වැඩි අවධානයක් යොමු කරනු ලබන්නේ ආයතනගත රැකවරණයට වඩා ප්‍රජා පාදක විකල්ප රැකවරණයන් පිළිබඳවය. එක්සත් ජාතීන්ගේ විකල්ප රැකවරණයට අදාළ මාර්ගෝපදේශයන් (2010) මෙන්ම ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය (2019) අනුව පවුල් පාදක ස්ථිර විසඳුමක් ලබාදීමට අපොහොසත් වූ විට හෝ එය දරුවාගේ උපරිම යහපත සඳහා ඉවහල් නොවන විට විකල්ප රැකවරණයන් අතරින් පළමුව පවුල් පාදක රැකවරණයත්, අනතුරුව පවුලක වැනි රැකවරණය හා අවසානයේ විකල්ප ආයතන ගත රැකවරණයත් වශයෙන් ප්‍රමුඛතාගත කොට දරුවා හට වඩාත්ම උචිත විකල්ප රැකවරණය හඳුනා ගැනෙන බවටත් එම රැකවරණය සැලසීම එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කෙරෙන බවටත් තහවුරු කළ යුතුය.

නිම්නා දැරිය සදහන් කරන පරිදි ඇය වර්තමානයේදී පවුල් පාදක රැකවරණයට අයත් ඥාතී රැකවරණය යටතේ සිටී. ඇය කුඩා කලම ඇයගේ පියා මිය ගොස් ඇති අතර මව පියාගේ අභාවයෙන් සතියකට පසු ඇයව පිය පස මිත්තණිය හා ඥාතීන් භාරයේ තබා නිවසින් පිටව ගොස් ඇත. පිය පස මිත්තණිය හා ඥාතීන්ගේ රැකවරණය යටතේ හැදී වැඩුණු ඇය වයස අවුරුදු 13 දී පමණ ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ. මිත්තණිය වයස්ගත වීම හේතුවෙන් ළමයින් හා යෞවනයන් පිළිබද ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සුදුසු පුද්ගලයෙකු ලෙස ඇයගේ නැන්දණිය වෙත පවුල් පාදක ඥාතී රැකවරණය යටතේ ඇය බාරදී ඇතත් වර්තමානයේදී ඇය සිය නැන්දණිය සමීපයෙහි ජීවත්වීම දැඩි ලෙස ප්‍රතික්ෂේප කරනු ලබයි. ඇය ළමා මවක් බැවින් මෙහිදී ඇයගේ උපරිම යහපත මෙන්ම ඇයගේ දරුවාගේ උපරිම යහපත කෙරෙහිද තර්ජනයක් පවතින බව හදුනාගත හැකිය.

චේතනා දැරිය විවාහක දෙදරු පියෙකු වන සැකකරුවකු විසින් ස්ත්‍රී දූෂණය වරදට ගොදුරු කරගත් දැරියකි. අධිකරණ නියෝගයක් මත ළමා නිවාසගත කරන ලද ඇය පිරිමි දරුවෙකු ප්‍රසූත කිරීමෙන් අනතුරුව මුහුණ දුන් මානසික අක්‍රමතාවයට ප්‍රතිකාර ලබාදීමෙන් පසු ඇයගේ දරුවා ළමා නිවාසගත කොට ඇය දෙමාපියන් වෙත භාරදී තිබේ. එහෙත් දෙමාපියන් සමග ජීවත්වීම ඇය දැඩි ලෙස ප්‍රතික්ෂේප කරයි.

*"මට අම්මයි තාත්තයි එක්ක මෙහෙ ඉන්ඩ බෑ. මෙහෙ ඉන්නකොට මට ඉස්සර වෙච්ච දේවල් එකින් එක මතක් වෙනවා. එතකොට ලොකු බයක් හිතට දැනෙනවා. සමහර දවස් වලට තාත්තා බෙහෙත් ගේන්න යනවා. අම්මා වැඩට යනවා. මල්ලී ඉස්කෝලෙ යනවා. මම විතරයි ගෙදර තනියම ඉන්නෙ අරූ (සැකකරු) මාත් එක්ක තරහින් ඉන්න නිසා අපේ ගෙදරට ඇවිත් මාව මරල දාවි කියලා මට ගොඩක් බයයි. ඒක නිසා මම වලපනේ අත්තම්මා ළගට යන්න ඕනෑ."*(චේතනා ප්‍රත්‍යයෙක අධ්‍යයන 09, 22/02/2022)

විකල්ප රැකවරණය සඳහා චේතනා දැරිය ඇයගේ දෙමාපියන් වෙත භාර දී ඇතත් ඇයගේ විකල්ප රැකවරණයේ සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලු සහගත තත්ත්වයක් තිබේ. ඇය පියපස මිත්තණිය සමීපයට යාමට කැමැත්තෙන් පසුවුවද ඇය වයස්ගතවීම හා නිතර රෝගාතුරවීම හේතුවෙන් ඇය මෙම දැරිය තමන්ගේ භාරය හා රැකවරණයට පත් කිරීමට කැමැත්තක් නොදක්වන බව පරිවාස කාර්යාලයේ ඇති ලිපිගොණුවේ සඳහන්ව ඇත.

නදී දැරියගේ ප්‍රකාශය තුළින්ද පැහැදිළි වන්නේ ඇයගේ භාරය හා රැකවරණය සඳහා ඇය පියා වෙත භාරදී ඇතත් ඇය පියා සමීපයේ සිටීම ප්‍රතික්ෂේප කරන බවයි.
*"මට තාත්තත් එක්ක මේ ගෙදර ඉන්න බෑ. තනියම ඉන්නකොට හිතට එක එක දේවල් එනවා. ගමේ හැමෝම මා දිහා බලන්නෙ අමුතු විදිහට. ඒ මදිවට නිතරම එක එක දේවල් කියනවා. ඒ හින්දා පොඩි අක්කලාගෙ ගෙදර යන්න මම කැමතියි."*(නදී, ප්‍රත්‍යයෙක අධ්‍යයන 09, 23/02/2022)

නදී දැරිය අවස්ථා කිහිපයකදී ස්ත්‍රී දූෂණය වරදට ගොදුරු වී තිබේ. එසේම අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරදටද ගොදුරු වී ඇති දැරියකි. එබැවින් අතීත අත්දැකීම් මතකයට පැමිණීමෙන් නැවත වතාවක් ඇය වින්දිතයෙකු බවට පත්වීමට ඉඩ ඇති බැවින් ඇයගේ සුරක්ෂිතතාවය තවදුරටත් තහවුරු විය යුතුය.

අනෙකුත් ප්‍රතිචාරකයින් පිළිබඳව අවධානය යොමුකිරීමේදී හඳුනාගත හැකි වූයේද ඔවුන්ගෙන් බහුතරයක් විකල්ප රැකවරණයේ සුරක්ෂිතතාවය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක පවතින බවයි.

*"මට මේ ගෙදර හැමෝම පේන්න බෑ. බාප්පටයි සීයටයි මම ශාප කරනවා. ඒගොල්ලො මගේ ජීවිතය විනාශ කළා. මාව නැති කළා. මේකට මගේ අම්මත් වග කියන්න ඕනෑ. කොහේ හරි නිදහස් තැනකට ගිහිල්ලා මට පාඩුවේ ඉන්න තියනවා නම් හොඳයි කියලා මට හැමවෙලේම හිතෙනවා"* (සුපුනි, ප්‍රත්‍යයෙක අධ්‍යයන 06, 20/02/2022)

*"අම්මයි තාත්තයි එයාලගෙ වැඩ. හැම වෙලේම මට බනිනවා මිසක් කවදාවත් හොඳක් නම් අහන්න ලැබෙන්නේ නෑ. ඒ මදිවට අයියලා දෙන්නයි අක්කයි තුන් දෙනාම මාත් එක්ක වැඩිය හොඳ නෑ. එයාලා මාව ප්‍රතික්ෂේප කරනවා කියලා තමයි මට හිතෙන්නේ. ඒ නිසා මට මේ ගෙදර ඉන්න එක දැන් තිත්ත වෙලා තියෙන්නේ."*(ටානියා, ප්‍රත්‍යයෙක අධ්‍යයන 01, 20/02/2022)

ඉහත සියලුම ප්‍රතිචාරකයින්ගේ ප්‍රකාශනයන් පිළිබඳව අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් පවතින බවයි.

**සංවර්ධනය**

1989 වර්ෂයේදී සම්මත කරගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබද ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 27 වන වගන්තිය තුළ සදහන් වන්නේ ළමයාගේ කායික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක සහ සමාජීය වර්ධනය සදහා ප්‍රමාණවත් වන්නා වූ ජීවන තත්ත්වයකට සෑම ළමයෙකුගේම ඇති අයිතිවාසිකම පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබිය යුතු බවයි. මෙම අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීම පිණිස දෙමවුපියන්ට හා ළමයා සම්බන්ධයෙන් වගකියන්නා වූ වෙනත් තැනැත්තන්ට ආධාර කිරීමේ සුදුසු පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, ජාතික තත්ත්වයන්ට අනුකූලව සහ තම තමන්ගේ ශක්ති ප්‍රමාණය ඇතුළත ගනු ලැබිය යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී විශේෂයෙන්ම පෝෂණය, ඇඳුම් පැළඳුම් සහ නිවාස සම්බන්ධයෙන් ද්‍රව්‍යමය ආධාර වැඩ පිළිවෙලවල් ඇති කිරීමද කරනු ලැබිය යුතුය.

එම වගන්තිය මගින් ළමා සංවර්ධනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කොට තිබේ. පූර්ණ ළමා සංවර්ධනයක් සදහා කායික, මානසික, ප්‍රජානන , සදාචාරාත්මක සහ සමාජීය වර්ධනයක් අත්‍යාවශ්‍ය වේ. "ළමයාගේ ශාරීරික , මානසික, චිත්තවේගික ආදී වශයෙන් වූ සමස්ත ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වන සංවර්ධනය අනුක්‍රමිකය" ( අබේපාල, 2010, පි:66) . ළමා සංවර්ධනය යනු පරිසරයේ අන්තර් ක්‍රියාකාරීත්වය හේතුකොටගෙන බැහැරින් ලැබෙන උදවු උපකාර සහයෝගය මත ළමයා තුළ ඇතිවන අනුක්‍රමික වෙනස්කම් මාලාවයි. පරිසර සාධක මගින් පෝෂණය, ආහාර, සෞඛ්‍ය, ආදරය, භාෂාව, සිරිත් විරිත් ආදී වශයෙන් සත්කාර කරමින් ළමයා සංවර්ධනය කළ යුතුය.

පෝෂණය ළමයෙකුගේ ශාරීරික වර්ධනය සදහා බලපාන්නා වූ ඉතා වැදගත් සාධකයකි.ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද මූලික මානව අවශ්‍යතා අතරින් ප්‍රමුඛත්වය දරන පෝෂණය නව යොවුන් වයසේ පසුවන ගැහැණු ළමයින් සදහා

අත්‍යවශ්‍ය වේ. ලිංගික අපයෝජනයට ගොදුරු වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතැම් ගැහැණු ළමුන් හට පෝෂණ අවශ්‍යතා නිසි පරිදි නොලැබීමට ඉඩ තිබේ.ළමයෙකුගේ උපරිම යහපත සලකා බැලීමේදී මෙම පෝෂණ අවශ්‍යතා නිසි පරිදි ලැබේද යන්න පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

*"මම දවස් ගණනක් නොකා නොබී ඉදලා තියනවා.කුලී වැඩට ගියාම කෑම ගැනවත් හිතන්න වෙලාවක් නෑ.මට මොනව වුනත් කමක් නෑ දරුවන්ට කිරිපිටි පැකට් අරගන්න මම මහන්සි වෙලා වැඩ කරනවා"*

*(නිම්නා,ප්‍රකාශක අධ්‍යයන 02,20/02/2022)*

නිම්නා දැරියගේ ඉහත ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ඇයගේ පෝෂණ අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වීමක් සිදු නොවන බවයි.නිසි පෝෂණය නොලැබීම පසුකාලීනව ගැටලු රැසකට ඉහවල් වන බැවින් ළමා මවක් වන ඇය තම පෝෂණය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්වීම අනිවාර්යවේ. මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියට අනුව අනෙකුත් මානව අවශ්‍යතා ඉටු කර ගැනීමට පෙර මූලික කායික අවශ්‍යතාවක් වන පෝෂණ අවශ්‍යතාවය ඉටුවිය යුතුය.එහෙත් නිම්නා දැරියගේ වර්තමාන ජීවිතය තුළ එම අවශ්‍යතාව නිසි පරිදි ඉටු නොවන බව දක්නට ලැබේ.

අධ්‍යයනයට ලක් වූ අනෙකුත් දැරියන් පිළිබඳව සැලකිලිමත් වීමේදී හදුනාගත හැක්කේ බහතරයක් ළමුන් හට පෝෂණ අවශ්‍යතා නිසි පරිදි ඉටු නොවන බවයි.ඒ සදහා පවුලේ ආර්ථික ගැටුම් බලපා තිබේ.පවුලේ ආර්ථික ගැටලු හේතුවෙන් බොහෝ අවශ්‍යතා වලදී පෝෂදායි ආහාර වේලක් ලබාගැනීමට මොවුන් හට හැකියාවක් නොමැත.

මෙහි අධ්‍යයනයට සහභාගී වූ ප්‍රතිචාරකයින් සියලුම දෙනාගේ සංවර්ධනය පිළිබඳව සලකා බැලීමේදී හඳුනාගත හැකි වන්නේ ඔවුන්ගේ ළමා සංවර්ධනය විධිමත් ආකාරයෙන් සිදු නොවන බවයි. ටානියා දූරිය ප්‍රධාන වශයෙන් පවුලේ සාමාජිකයින් සමඟ හා සමාජය සමග සබදතා පැවැත්වීමට අපොහොසත්ව මානසිකව ගැටලු සහගත තත්ත්වයක පසු වන අතර නිම්නා දූරිය, චේතනා දූරිය හා සදලි දූරිය ළමා මව්වරුන් බවට පත් වී තිබේ. සුපුනි දූරිය මානසික අක්‍රමතාවයකට ගොඳුරු වී ඇත. නදී දූරිය මව් සෙනෙහස ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පසු වන අතර නෙත්මි දූරිය පිය සෙනෙහස අපේක්ෂාවෙන් පසු වේ. අනෙකුත් ළමුන්ගේ සංවර්ධනයද ලිංගික අපයෝජනයට ගොඳුරුවීමේ ප්‍රතිඵලයක් ලෙස අඩාලව පවතී.

**යහපැවැත්ම**

ලිංගික අපයෝජනයට ගොඳුරු වී විකල්ප රැකවරණයේ පසු වන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා යහපැවැත්ම ඉතාවැදගත් සාධකයකි. ළමා යහපැවැත්ම විවිධ ආකාරවලින් අර්ථ දක්වා ඇති අතර, මෙම යෙදුම පුළුල් පරාසයක වෘත්තිකයන්, පර්යේෂකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් භාවිතා කරනු ලැබේ. ළමා යහපැවැත්ම පිළිබඳ යුනිසෙෆ් නිර්වචනය බොහෝ විට යොමු කිරීමක් ලෙස භාවිතා කරන අතර යහපැවැත්ම පිළිබඳ පුළුල් දෘෂ්ටියක් ගනී: "ජාතියක ස්ථාවරයේ සැබෑ මිනුම වන්නේ එය තම දරුවන්ට ඔවුන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව, ඔවුන්ගේ ද්‍රව්‍යමය ආරක්ෂාව, ඔවුන්ගේ

අධ්‍යාපනය සහ සමාජගත වීම සහ ඔවුන් ඉපදී සිටින පවුල් සහ සමාජ තුළ ආදරය, අගය කිරීම සහ ඇතුළත් කිරීම පිළිබඳ ඔවුන්ගේ හැඟීමයි."(UNICEF, 2007). යුනිසෙෆ් නිර්වචනය ළමා යහපැවැත්ම සඳහා පාරිසරික ප්‍රවේශයක් ගන්නා අතර, සමස්තයක් ලෙස දරුවෙකුගේ ජීවිතය වට කර ගනිමින් සහ සියලු ළමා අත්දැකීම් ඔවුන්ගේ සමස්ත යහපැවැත්මට දායක වන බව හඳුනා ගනී. පුළුල් අර්ථයකින්, යහපැවැත්ම යනු දරුවන්ගේ යහපත් ජීවිතයක් සඳහා නිර්ණායක, වර්ධනයේ සහ සංවර්ධනයේ ප්‍රවර්ධකයින් සහ දරුවාගේ සතුට සහ තෘප්තිය පිළිබඳ හැඟීම් වැඩි දියුණු කරන සාධක විස්තර කරයි. (Helseth & Haraldstad, 2014) .

පොදුවේ ළමයින්ගේ යහපැවැත්ම සඳහා කටයුතු කිරීමේදී කායික යහපැවැත්ම, මානසික යහපැවැත්ම, සමාජීය යහපැවැත්ම හා අධ්‍යාත්මික යහපැවැත්ම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. කායිත යහපැවැත්ම සඳහා කායික වශයෙන් ලැබිය යුතු අවශ්‍යතා සැපිරිය යුතු අතර මානසික හා සමාජීය යහපැවැත්ම සඳහා සඳහා මනෝ සමාජීය අවශ්‍යතා ඉතා වැදගත් වේ. ලිංගික අපයෝජනයට ලක්ව සිටින ගැහැණු ළමුන්ගේ යහපැවැත්ම උදෙසා කටයුතු කිරීමේදී මනෝ සමාජීය අවශ්‍යතාවයන් කොතෙක් දුරට සැපිරී ඇත්දැයි යන්න පිළිබඳව මෙහිදී විශේෂ අවධානයක් යොමු කළ අතර අධ්‍යයනයට ලක් වූ ප්‍රතිචාරකයින්ගේ ප්‍රතිචාර තුළින් ඔවුන්ගේ මනෝ සමාජීය අවශ්‍යතාවයන් සැපිරී ඇති ආකාරය හඳුනාගත හැකිය.

*"මම ගිය ආත්මෙ ලොකු පවක් කරන්න ඇති ඒකයි පොඩි කාලෙම අම්මගෙයි තාත්තගෙයි ආදරය අහිමි වුණේ. දැන් නම් මට මගේ ජීවිතය එපා වෙලා තියෙන්නෙ. මැරෙන්ඩ කියලා හිතුණු වාර අනන්තයි. ඒත් මම මැරුණොත් මේ දරුවා අසරණ වෙනවා. අදටත් මම* ජීවත් වෙන්නේ මේ දරුවා නිසා. මොකද මට අත්වුණ ඉරණම මේ දරුවට අත්වෙනවට මම කැමති නෑ."(නිම්නා, ප්‍රත්‍යයෙක අධ්‍යයන 08, 21/02/2022)

ලිංගික අපයෝජනයට ලක්වී ළමා මවක් බවට පත්වී සිටින නිම්නා දැරියගේ ප්‍රකාශය තුළින් පැහැදිළි වන්නේ ඇය හට මනෝ සමාජීය අවශ්‍යතා නිසි ලෙස නොලැබෙන බවයි. ලිංගික අපයෝජනයට ගොදුරු වූ ගැහැණු ළමුන් මනෝ විද්‍යාත්මකව හා සමාජ විද්‍යාත්මකව බරපතල අවදානම් සහගත තත්ත්වයන්ට මුහුණ පාන අතර ඔවුන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම සඳහා කටයුතු කිරීමේදී මනෝවිද්‍යාත්මක උපදේශනය ඵලදායී ලෙස යොදා ගැනීමට හැකියාව තිබේ. කරුණාරත්න (2015) සඳහන් කර ඇත්තේ ලිංගික අපයෝජනයට ගොදුරු වී ආයතන ගත ළමුන් නැවත සමාජගත කිරීමේදී මනෝවිද්‍යාත්මක උපදේශනය ඵලදායී අන්දමින් යොදා ගත යුතු බවයි. පුද්ගල, පවුල් හා කණ්ඩායම් උපදේශනය මෙන්ම ප්‍රජා උපදේශනයද ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමුන්ගේ මනෝ සමාජීය අවශ්‍යතා සපුරාලීමේදී අත්‍යාවශ්‍ය වේ. මනෝ විද්‍යාත්මක උපදේශනය මගින් ලිංගික අපයෝජනයට මුහුණ දීමෙන් බිඳ වැටී ඇති ආත්ම අභිමානය නංවාලීම, මානසික අක්‍රමතා සඳහා ප්‍රතිකාර කිරීම, මනෝ සමාජීය අධ්‍යාපනය ලබාදීම මෙන්ම ප්‍රජානනය හා චර්යාව වෙනස් කිරීමට හැකියාව ඇත. එබැවින් ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන් සඳහා ද මනෝ විද්‍යාත්මක උපදේශනයේ අවශ්‍යතාවය නිම්නා දැරියගේ ප්‍රකාශය තුළින් තහවුරු වේ.

මනෝ සමාජීය අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කිරීමේ ප්‍රතිචාරකයින් දැක්වූ පහත සඳහන් අවශ්‍යතා ඔවුන්ගේ යහපැවැත්ම කෙරෙහි ඉතා වැදගත් වේ.

1 පිළිගැනීම
2 ආදරය, කරුණාව හා දයාව
3 රැකබලා ගන්නන්ගේ උණුසුම් සහගත සෙනෙහස හා රැකවරණය
4 විවේකය හා විනෝදාශ්වාදය
5 ආත්ම අභිමානය
6 සමපදස්ථ ඇසුර
7 සමාජ ක්‍රියාකාරකම්
(ක්ෂේත්‍ර දත්ත, 2022)

ටානියා දැරියගේ ප්‍රකාශය අනුව පැහැදිළි වන්නේ ඇයට සිය නිවස තුළ මනෝ සමාජීය අවශ්‍යතා සපුරා ගැනීමට ඉඩකඩ නොමැති බවයි.

*"අම්මයි තාත්තයි හැම වෙලාවෙම කියන්නෙ මම එයාලගෙ මූණෙ දැලි ගෑව කියලා. මම නිසා එයාලට පාරේ බැහැලා යන්න බැරිලු. අයියල දෙන්නයි අක්කයි ඉස්සර වගේ මට ආදරය දක්වන්නේ නෑ. ගමේ මිනිස්සු මා දිහා බලන්නෙ සමච්චලයට මට දැන් හැමදේම එපා වෙලා තියෙන්නේ. මේක මහා කරුමයක්. "*(ටානියා, ප්‍රත්‍යෙයක අධ්‍යයන 01, 21/02/2022)

මෙහිදී අධ්‍යයනයට ලක් වූ චේතනා දැරියගේ ප්‍රකාශය තුළින් මනෝ සමාජීය අවශ්‍යතාවය පිළිබඳ තහවුරු වේ.
*"මම කොච්චර හොඳට හිටිය කෙනෙක්ද? උෟ මාව බය කරලා මගේ ජීවිතයම විනාශ කලා. දැන් මට මගේ යාළුවො වගේ ඉස්කෝලේ යන්න විදිහක් නැහැ. මේ සිද්ධිය නිසා මට කාටවත් මුහුණ දෙන්න විදිහක් නෑ. ඇයි මට මෙහෙම වුනේ කියලා මට හිතා ගන්නවත් බෑ."*(චේතනා, ප්‍රත්‍යයෙක අධ්‍යයන 01, 21/02/2022)

සමාජීය යහපැවැත්ම ළමයෙකුගේ උපරිම යහපත කෙරෙහි බලපාන ආකාරය හඳුනා ගැනීමට චේතනාගේ ප්‍රකාශය ප්‍රබල සාක්ෂියකි. ළමා සංවර්ධනයේදී මනෝ සමාජීය යහපැවැත්ම ඉතා වැදගත් වේ. ඒ සඳහා මනෝ සමාජීය අවශ්‍යතා සැපිරීමට කි්‍යා කිරීම තුළ ළමුන්ගේ උපරිම යහපත සැලසීමට අවකාශය සැලසේ.

**සුභ සාධනය**

සුභ සාධනය යනු ඉතා පුළුල් වූ අර්ථයක් ගෙන දෙන සංකල්පයකි. සුභ සාධනය මගින් මිනිසුන්ගේ යහපත් පැවැත්මට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සිදු කරනු ලබයි. වෝල්ටර් ෆ්‍රිඩ්ලැන්ඩර් (1961) සඳහන් කරනු ලැබ ඇත්තේ තෘප්තිමත් ජීවන මට්ටමක් හා සෞඛ්‍ය තත්වයක් ඇති කර ගැනීමෙහිලා පුද්ගලයින් හා කණ්ඩායම් වලට අමතර උපකාර කිරීම අරමුණු කර ගත් සංවිධිත ආයතන හා සේවා පද්ධතිය සමාජ සුභ සාධනය බවයි. ෆ්‍රිඩ්ලැන්ඩර් සඳහන් කරන ආකාරයට යහපත් ජීවන මට්ටමක් හා සෞඛ්‍ය තත්වයක් සමාජය තුළ සමාන ඉඩ ප්‍රස්ථා, සිතීමේ හා ක්‍රියා කිරීමේ අයිතිවාසිකම් හා උපරිම මට්ටමේ ආත්ම ගරුත්වයක් ආදිය ලබාදීමට ක්‍රියා කිරීම සමාජ සුභ සාධනවාදයේ අරමුණයි. ළමුන් සම්බන්ධ අවශ්‍ය යොමු කිරීමත් ළමුන්ගේ අවශ්‍යතා අවම මට්ටමින් හෝ තෘප්තිමත් ජීවන මට්ටමක් ඔවුනට ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක වන්නා වූ සේවා ව්‍යුහයන් මෙන්ම ප්‍රතිශක්ති හා

වැඩ සටහන් ළමා සුභසාධනය ලෙස සරලව හඳුනා ගත හැකිය. ළමා සුභසාධනය තුළ මාර්ගෝපදේශ සේවා,නිවැරදි කිරීමේ සේවා,නිවාරණාත්මක සේවා මෙන්ම සංවර්ධනාත්මක සේවා යන සියළුම සේවාවන් අන්තර්ගත වේ. ළමා සුභසාධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේදී මූලිකම ඉලක්කය වන්නේ අදාළ ළමයා හා ඔහු ජීවත් වන ස්ථානයයි. ඒ අනුව ළමයින්ගේ අවශ්‍යතා අවම මට්ටමේ සිට උපරිම මට්ටම දක්වා රැගෙන ඒමට ළමා සුභසාධනයේ උත්සහ ගනී.ළමයා ජීවත් වන පවුලේ ආර්ථිකය ඉහළ නැංවීමට කටයුතු කිරීම,පවුල සවිබල ගැන්වීම,පවුලට උපදෙස් දීම සහ මාර්ගෝපදේශයන් ලබා දීම, උපදේශන සේවාවන් ලබා දීම හා වෙනත් ළමුන්ගේ සුභසාධනයට අවශ්‍ය සේවාවන් ලබා දීම ළමා සුභසාධනයේදී සිදු වේ.

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේදී ළමා සුභසාධනය කෙරෙහි සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ.

මෙහි ප්‍රතිචාරකයින් සියලුම දෙනා අදහස් දැක්වූයේ ඔවුන් සඳහා මෙතෙක් විධිමත් උපදේශන සේවාවක් ක්‍රියාත්මක නොවූ බවයි.ලිංගික අපයෝජනයට ගොදුරු වූ දරුවන් හට පසුකාලීනව විවිධ ගැටළුකාරී තත්වයන් ඇතිවීමේ ඉඩප්‍රස්ථා අධික වේ. ඒ අනුව විවිධ වූ මානසික අක්‍රමතාවන්ට ගොදුරු වීම, හැසිරීමේ ගැටලු ඇතිවීම යනාදි වූ ගැටලු රැසක් ඇතිවීමට අවස්ථාව ඇති අතර අවශ්‍යතාවන් වළකා ගැනීමට මනෝ විද්‍යාත්මක උපදේශනය ඉතා වැදගත් වේ. නමුත් අවශ්‍යතාවන්ට ලක් වූ ප්‍රතිචාරකයින් සියලුම දෙනාගේ ප්‍රකාශයන් තුළින් තහවුරු වී ඇත්තේ ඔවුන් විකල්ප රැකවරණයේ සිටි කාලවකවානුව තුළ ඔවුන් සඳහා විධිමත් උපදේශන සේවාවක් ලැබී නොමැති බවයි.

*"මගේ ලෙඩේට මම හලාවත රෝහලෙන් බෙහෙත් ගන්නවා.දැන්නම් ගොඩක් හොදයි.එහෙ ඩොක්ටර් කිව්වා තව අවුරුද්දක් විතර යනකන් මට උපදේශනය අවශ්‍යයි කියලා"(සුපුනි,ප්‍රත්‍යයක අධ්‍යයන 06,20/02/2022)*

සුපුනි දැරිය විශාදය අක්‍රමතාවයෙන් පසුවන බැවින් හලාවත මූලික රෝහලෙන් ප්‍රතිකාර ලබා ගනී.ඇය හට ඉදිරියටත් උපදේශන අවශ්‍ය බව එම රෝහලේ වෛද්‍යවරයා ඇයට පවසා තිබේ.එහෙත් මේ වන විටත් ඇය උපදේශන සේවාවකට යොමු වී නොමැති බව මෙහිදී අනාවරණය විය.කරුණාරත්න (2015) සඳහන් කර ඇත්තේ පරිවාස දෙපාර්තමේන්තුවේ සෑම පරිවාස කාර්යාලයකටම සුදුසු උපදේශකවරයෙකු සිටීම අත්‍යවශ්‍ය බවයි. ඒ බව සුපුනිගේ ප්‍රත්‍යයක අධ්‍යයනය මගින් නැවත වරක් තහවුරු වී තිබේ.

ළමා මවුවරුන් දෙදෙනෙකු වන නිම්නා සහ චේතනා යන ළමුන් සඳහා ද මනෝවිද්‍යාත්මක උපදේශන සේවාව අත්‍යාවශ්‍ය බව පැහැදිලි වේ. විශේෂයෙන් නිම්නා දැරිය ප්‍රකාශ කළ තොරතුරු අනුව ඒ බව වඩාත් තහවුරු වේ.

*"මම දෙපාරක්ම ජීවිතේ නැති කර ගන්න උත්සහ කළා.ඒත් පුතා ගැන සිතලා ඒ දෙවතාවම ඉවසුවා.මට දැන් මේ ජීවිතේ එපා වෙලා ඉන්නේ.අනේ මාවයි දරුවයි ළමා*

*නිවාසෙකට ඇරලවන්ඩ එතකොටවත් හිතේ සතුටින් ඉන්ඩ පුළුවන් වෙයි"*(නිම්නා ප්‍රත්‍යයෙක අධ්‍යයන 08, 21/02/2022)

සුදුසු පුද්ගල පරිලෝචන නියෝගයක් යටතේ සිය නැන්දනිය වෙත ලබා දී ඇති නිම්නා දැරිය නැන්දා සමීපයේ සිටීම දැඩි ලෙස ප්‍රතික්ෂේප කරයි. වසරක් පමණ වන සිය දරුවාගේ නඩත්තුව වෙනුවෙන් ඇය කම්කරු රැකියාවක නියැලෙන බවත්,සැකකරු නැන්දනියගේ නිවසට නිතර පැමිණෙමින් රාත්‍රියට ඔහු සමග නිදා ගැනීමට ඔහු සමීපයට එන ලෙස බල කරමින් තමාට පහර දෙන බවත්,නැන්දනිය ඒ සඳහා අනුබල දෙන බවත් මේ සියලු කාරණා හේතුවෙන් ජීවිතයම එපා වී ඇති බවත් නිම්නා සඳහන් කරයි.එබැවින් නිම්නා දැරියගේ සුභසාධනය උදෙසා ඇයට උපදේශන සේවාවන් කඩිනමින් ලබා දිය යුතුව තිබේ.

ප්‍රතිචාරකයන් සඳහා උපදේශන සේවාවන්ට අමතරව ඔවුන්ගේ පවුල්වල ආර්ථිකය ඉහළ නංවාලීමේ වැඩසටහන් ද අවශ්‍ය වේ.එසේම ඔවුන් හට වෘත්තිය පුහුණු අවස්ථා ලබා දීම මෙන්ම ස්වයං රැකියා සඳහා යොමු කිරීම ද ඔවුන්ගේ සුභසාධනය සඳහා වඩාත් ඵලදායි වේ.ඔවුන්ගේ උපරිම යහපත උදෙසා ඵලදායි සුභසාධන සේවාවන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම වැදගත් බව ඔවුන්ගේ ප්‍රතිචාර තුළින් පැහැදිලි වේ.

**පුනරුත්ථාපනය**

පුනරුත්ථාපනය යනු යම් සමාජ විරෝධි ක්‍රියාවකට හෝ යම් කායික හෝ මානසික අපහසුතාවකට පත් වූ පුද්ගලයන් එයින් සම්පූර්ණයෙන්ම හෝ සැලකිය යුතු මට්ටමකින් මුදා ගැනීම සඳහා සිදු කරනු ලබන ඵලදායි වැඩ පිළිවෙළකි.මූලාශ්‍ර තොරතුරු ග්‍රන්ථයේ උපුටා දක්වමින් කරුණාතිලක (1998) සඳහන් කරන්නේ පුනරුත්ථාපනය යනු සමාජයේ එකම වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් හා සමාන ලෙස තම අයිතිවාසිකම් වලට උරුමකම් කීමටත් එවැනි අවස්ථාවක් උදාකර ගැනීමටත් පුද්ගලයින්හට කායික සහ භෞතික ලෙස මනෝවිද්‍යාත්මකව සහ සමාජීය ලෙස උදවු කිරීමේ ක්‍රියාවලිය බවයි.

ලිංගික අපයෝජනයට ගොදුරු වූ ගැහැණු දරුවන් පසුකාලීනව සමාජ විරෝධි චර්යාවන්ට යොමුවීමට මෙන්ම කායික හා මානසික ලෙස විවිධාකාර වූ ගැටලු සහගත තත්වයන්ට පත්වීමට ඇති නැඹුරුව සුලභය.එබැවින් ඔවුන්ගේ උපරිම යහපත සිදුවීම සඳහා ඔවුන් විධිමත් වූ පුනරුත්ථාපනයකට ලක් කළ යුතුව තිබේ.එහිදි ඔවුන් හට වඩා උසස් මට්ටමේ ජීවන තත්වයක් ගොඩ නගා ගැනීමට අවශ්‍ය පුහුණු කිරීම්, නැවත පුහුණු කිරීමලඅධ්‍යයනය සමාජීය හා වෘත්තීමය වැඩ පිළිවෙළක් සකස් කිරීම සිදුවිය යුතුය.මෙම අධ්‍යයනයෙන් ප්‍රචාරකයින්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමුකිරීමේ දී හඳුනාගත හැක්කේ විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් ඔවුන් උදෙසා ක්‍රියාත්මක නොවන බවයි. ඒ බව ටානියාගේ ප්‍රත්‍යයක අධ්‍යනයෙන් වඩාත් පැහැදිලි වෙයි.

*"මම ළමා නිවාසයේ ඉන්න කාලේ සතුටින් හිටියා. අපිට දිනපතා විවිධ වැඩසටහන් තිබුණා. වෛද්‍යවරු, උපදේශකවරු නිතරම අපි ගැන සොයා බැලුවා. අපේ ප්‍රශ්න ගැන ලොකු අවධානයක් දුන්නා. ඇත්තටම ඒ කාලේ මම ගොඩක් සතුටින් තමයි හිටියේ"(ටානියා, ප්‍රත්‍යයක, අධ්‍යයන 01, 21/02/2022)*

ටානියා දැරියගේ ඉහත අදහස අනුව පෙනී යන්නේ දැනට ඇය ගත කරන ජීවිතයට වඩා ප්‍රීතිමත් සහ සතුටුදායක ඇය ළමා නිවාසගතව සිටින විට ගත කොට ඇති බවයි. විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ ඉදිරි අනාගතය යහපත් වීම සඳහා ඵලදායි වූ පුනරුත්ථාපන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක ක්‍රියාත්මක විය යුතු බව ඇයගේ ප්‍රකාශනයෙන් පැහැදිලි වේ.

නදී දැරියගේ *ප්‍රත්‍යයක* අධ්‍යයන මගින්ද විකල්ප රැකවරණයේ පසුවන ලිංගික අපයෝජනයෙහි වින්දිත ගැහැණු ළමුන් සඳහා ඵලදායි පුනරුත්ථාපන ක්‍රියාවලියක අවශ්‍යතාවය හොඳින් ඉස්මතු වේ.ඇය කුඩා අවධියේම ස්ත්‍රී දූෂණ වරදට ගොදුරුවීමෙන් අනතුරුව පිරිමි ළමුන් කිහිපදෙනෙකු සමග ඇය එම අත්දැකීම ලබා ගෙන තිබේ. ඇයගේ අදහස් අනුව ඇය ඒ සඳහා දිගටම ඇබ්බැහි වී තිබේ.
*"මට නිතරම ඒ අද්දැකීම මතක් වෙනවා. එතකොට මට මාවම පාලනය කර ගන්ඩ බෑ.ඒකයි මම පිරිමි කීපදෙනෙක්ම ආශ්‍රය කළේ."(නදී, ප්‍රත්‍යයක අධ්‍යයන 07, 20/02/2022)*

විධිමත් පුනරුත්ථාපනයකට ලක් නොවීම තුළ ඇතැම් ඇබ්බැහිකාරී තත්වයන්ට ළමුන් ගොදුරු වන බවට මෙම ප්‍රකාශක අධ්‍යයන නිදසුනකි.

**විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා පවතින අභියෝග හා බාධක**

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි පවතින අභියෝග හා බාධක පිළිබඳව අවධානය යොමු කිරීමේදී ප්‍රතිචාරකයින් ලෙස ලිංගික අපයෝජනයට ගොදුරු වූ ගැහැණු ළමුන්,ඔවුන්ගේ භාරකරුවන් හා ඔවුන් අධීක්ෂණය කරනු ලබන පරිවාස නිලධාරීන් යොදා ගන්නා ලදී. ඔවුන් විසින් ලබා දෙන ලද තොරතුරු ඇසුරින් වර්තමානයේදී ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා පවතින අභියෝග හා බාධක පිළිබඳව අවබෝධ කර ගත හැකිය.

ප්‍රතිචාරකයින් අතරින් ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ අදහස් විමසීමේදී ඔවුන් මුහුණපාන අභියෝග සහ බාධක ලෙස සමාජ අපවාද සහ සමාජ සහය නොලැබීම,ඇතැම් පුද්ගලික කාරණා,අධ්‍යාපනය අතරමග නැවතීම හා නීතිය පිළිබඳ මෙන්ම ළමා අයිතිවාසිකම් පිළිබඳ නොදැනුවත්භාවය, නඩු විභාගය සඳහා දීර්ඝ කාලයක් ගතවීම යනාදිය සුවිශේෂී වේ. ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි අවශ්‍ය ප්‍රධානතම කාරණා වන ළමා ආරක්ෂාව, සංවර්ධනය, යහපැවැත්ම, සුහසාධනය සහ පුනරුත්ථාපනය යනාදිය විධිමත් ව සිදුවීම කෙරෙහි ඉහත සඳහන් අභියෝග හා බාධක ප්‍රබල ලෙස බලපෑමක් එල්ල කරනු ලබයි.

සමාජ අපවාදය පිළිබඳ අවධානය යොමු කිරීමේදී එය ප්‍රතිචාරකයින් බහතරයක් සඳහා බලපා ඇති ප්‍රබල අභියෝගයකි.ඔවුන් එය පවුලට හා සමාජයට කැලැලක් හා අපකීර්තියක් ලබා දීමට කටයුතු කළ බව පවසමින් ඔවුන්ගේ පවුල්වල ඥාතීන් මෙන්ම සමාජයේ විවිධ පුද්ගලයින් ඔවුන්ව විවිධාකාරයේ චෝදනා සහ අපකීර්තියට ලක් කිරීම් සිදු කරන බවට

ප්‍රතිචාරකයින් ප්‍රකාශ කොට ඇත.ඒ හේතුවෙන්ම බහුතරයකගේ අධ්‍යාපනය අතරමග නැවතී තිබේ.

ප්‍රතිචාරකයින් අතරින් ටානියාගේ අදහස් තුළින් ඒ බව හොඳින් පැහැදිලි වෙයි.

*"අපේ නැදෑයින්වයි ගමේ අයයි මාර අමාරුවක් තමයි තියෙන්නෙ.එයාලා නිතරම මට ඇනුම් පද කියනවා. අම්මයි තාත්තයි දෙන්නත් ඉස්සර වගේ නෙමේ.හැම වෙලාවෙම මගේ හිත රිදෙන විදිහට තමයි වැඩ කරන්නේ."(ටානියා,ප්‍රත්‍යෙයක, අධ්‍යයන 01, 21/02/2022)*

නදී දැරියගේ පියා පොලිස් නිලධාරියෙකු ලෙස සමාජීය වශයෙන් හොඳ පිළිගැනීමක් සහිතව ජීවත් වූ තැනැත්තෙකි.ඇයගේ සහෝදරයන් දෙදෙනා මේ වන විට උසස් අධ්‍යාපනය ලබයි.ඇය අඩු වයසින් ලිංගික අපයෝජනයට ගොදුරු වීම හේතුවෙන් පවුලේ ඥාතීන් මෙන්ම සමාජයේ විවිධ පුද්ගලයන් ඇයව සමාජ අපවාදයට ලක් කරන බව ඇය ප්‍රකාශ කරයි.

*"සමහර අය මට කියනවා තාත්තගේ මූණෙ දැලි ගාපු කාලකණ්ණි කෙල්ල කියලා."(නදී, ප්‍රත්‍යෙයක, අධ්‍යයන 01, 21/02/2022)*

නදී දැරියගේ අදහස් අනුව හඳුනාගත හැක්කේ සමාජීය වශයෙන් ඇය අපවාදයන්ට, සමච්චලයන්ට නිරතුරුව ලක්වන බවයි.එය ඇයගේ උපරිම යහපත කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කිරීමට හේතුවේ.මෙම සමාජ අපවාදයෙන් ගැලවීමට තම නිවසින් ඈත් වීමට ඇය උත්සහ ගනී.එය එක් පසකින් විකල්ප රැකවරණයේ සාර්ථක ප්‍රතිඵල ලැබීමට බාධකයකි.ඇයගේ මානසික සතුට බිඳ වැටීමට සමාජ අපවාද ප්‍රධාන හේතුවක් බවට පත් වී ඇත.එසේම ඇයගේ යහපැවැත්ම හා සංවර්ධනය කෙරෙහි තීරණාත්මක බලපෑමක් එල්ල කරනු ලබයි.

Goffman (1986) සඳහන් කර ඇති පරිදි අතාත්වික සමාජ අනන්‍යතාවය සමාජය විසින් අපේක්ෂා කරන ස්වාත්මක වන අතර එය පුද්ගලයා විසින් සිඳුකරතැයි සමාජය අපේක්ෂා කරයි. නමුත් සමාජ අන්තර් සම්බන්ධතා පැවැත්වීමේදී පුද්ගලයෙකුට සමාජය අපේක්ෂා කරන ආකාරයටම හැසිරිය නොහැකිය.සමාජය ප්‍රතික්ෂේප කරන හැසිරීම් මෙන්ම තම පුද්ගල කැමැත්තට අනුව ක්‍රියාකාරී වීම ආදිය හේතුවෙන් යථාර්ථ හැසිරීම අපේක්ෂිත හැසිරීමට වඩා වෙනස් විය හැකිය.එය සමාජ ධර්මතා හෝ අගනාකම්වලට යම් ආකාරයක නොගැලපීමක් විය හැකිය.එය දිගින් දිගටම සිදුවීමෙන් පුද්ගලයා පිළිබඳ සමාජ නිශේධනාත්මක තීන්දුවකට එළඹේ. එය පුද්ගලයාට කැළලක් (*Stigma*) සිදුවීමක් හෙවත් අපකීර්තියට පත්වීමක් ලෙස සැලකේ. මෙම අධ්‍යයනයෙහි බහුතරයක් ප්‍රතිචාරකයින් සමාජ අපවාදයට ලක්වීම තුළ ඔවුන්ගේ උපරිම යහපතට බාධාවක් පවතී.

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ළමුන් මුහුණ දෙන අභියෝග සහ බාධක අතරින් තවත් එක් වැදගත් බාධකයක් ලෙස ඇතැම් පුද්ගලබද්ධ

සාධක හදුනා ගත හැකිය.සමහරක් ප්‍රතිචාරකයින් තුළ ඔවුන්ටම සුවිශේෂී වූ පුද්ගලබද්ධ සාධක ඔවුන්ගේ උපරිම යහපතට බරපතල තර්ජනයක් වී තිබේ.ඒ අතරින් නිමාලි දැරියගේ පුද්ගලබද්ධ සාධක වෙත අවධානය යොමු කිරීම වැදගත් වේ.

*“මට පරිවාසෙ සර්ල මිස්ලා විතරක් නෙවෙයි නඩුකාරතුමියත් කිව්වා ඉස්කෝලෙ යන්න කියලා.ඒත් කවුරු කිව්වත් මම ආයෙත් නම් ඉස්කෝලෙ යන්නෙ නෑ.ඒක මගේ තීරණයක්.මට ඕනෙ නිදහසේ ගෙදරට වෙලා ඉන්න”(නිමාලි,ප්‍රත්‍යෙයක, අධ්‍යයන 01, 21/02/2022)*

වයස අවුරුදු 14 දී ලිංගික අපයෝජනයට ගොදුරු වු නිමාලි 09 ශ්‍රේණිය දක්වා පමණක් අධ්‍යාපනය ලබා තිබේ.අදාළ ලිංගික අපයෝජනයට ගොදුරු වීමෙන් පසු වර්තමානය දක්වාම ඇයගේ පාසල් අධ්‍යාපනය අඩාල වී තිබේ.පරිවාස නිලධාරීන් විසින් මේ පිළිබඳව මහේස්ත්‍රාත් දැනුවත් කොට මහේස්ත්‍රාත් විසින් දැරියට අවවාද කර ඇත.එසේ වුවත් වර්තමානයේදී ඇය නිවසට වී කාලය ගත කරනු ලබයි.

අධ්‍යයනයට ලක් වූ මෙම ගැහැණු ළමුන්ගේ උපරිම යහපතට බලපා ඇති අභියෝගයක් වන්නේ ඔවුන් බහුතරයකගේ පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීමට සිදුවීමයි.පුද්ගල සමාජානුයෝජනයෙහි කැපී පෙනෙන ආයතනයක් වන්නේ පාසලයි.පාසල් සමාජානුයෝජන කාරණයක් වශයෙන් මෙන්ම පුද්ගල කුසලතා පරිපූර්ණ කරනු ලබන විධිමත් ආයතනයක් වශයෙන් දරුවන්ගේ ජීවිතයෙහි වඩාත්ම වැදගත් අවධිය පෝෂණය කිරීමෙහිලා මහගු කාර්යභාරයක් ඉටු කරමින් සිටි(සුභසිංහ,2016,පි,68). ළමා පෞරුෂත්වය සංවර්ධනයේදී පාසල් අධ්‍යාපනය වඩාත් වැදගත් වේ.පාසල් අධ්‍යාපනය මගින් කුසලතා පූර්ණ ශිෂ්‍යයෙකු බිහිවන අතර රටේ අනාගත සංවර්ධනය උදෙසා එම පුද්ගලයාගේ දැනුම,කුසලතා සහ ආකල්ප ඵලදායි ලෙස යොදා ගත හැකිය.එහෙත් ලිංගික අපයෝජනයට ගොදුරු වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ගැහැණු ළමුන්ගේ පාසල් අධ්‍යාපනය අතරමග නැවැත්වීමට සිදුවීම රටේ සංවර්ධනයට ප්‍රබල තර්ජනයකි.

මෙම අධ්‍යනයෙන් හදුනාගනු ලැබේ. ඒ සඳහා ළමුන්ගේ උපරිම යහපතට බලපාන තවත් බාධකයක් වශයෙන් ළමුන්ට අදාළ නීතිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රතිචාරකයින් සතු දැනුම අවම මට්ටමක පැවතීමයි.ප්‍රතිචාරකයින්ගේ භාරකරුවන් බහුතරයක්ම ඒ පිළිබඳව දැනුමක්,අවබෝදයක් විධිමත් ආකාරයෙන් නොමැති බව මෙම අධ්‍යයනයේ දි හදුනා ගත හැකි විය.

*“අපේ දරුවා ගිය ආත්මෙ මොකක් හරි ලොකු පවක් කරලා ඇති.ඒකයි එයාට ඔහොම දෙයක් වෙන්න ඇත්තෙ.මට පුළුවන් විදිහට මම එයාව බලා ගන්නවා.”(විනුදි දැරියගේ මිත්තණිය,ප්‍රත්‍යෙයක අධ්‍යයන 04, 21/02/2022)*

මෙම මිත්තණියගේ අදහස වන්නේ පෙර කර්මයක් හේතුවෙන් දැරියට මෙම සිදුවීමට මුහුණ දී ඇති බවයි.ඇය ළමා අයිතිවාසිකම් හෝ ළමා නීතිය පිළිබඳ කිසිදු අවබෝදයකින් තොරව කටයුතු කරන බව මෙමගින් පැහැදිලි වෙයි.

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහුණු ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි බලපාන තවත් එක් ප්‍රබල සාධකයක් ලෙස භාරකරුවන්ගේ පවුලේ ආර්ථික අපහසුතාවයන් හඳුනා ගත හැකිය.ග්‍රාමීය කෘෂි ආර්ථිකයක් සහිත ප්‍රදේශයක ජීවත් වන මෙම පවුල්වල ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. කෘෂිකර්මාන්තය මගින් පවුලේ ආර්ථිකය නගා සිටුවීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලය වී ඇත්තේ මව හෝ පියා විදේශගත වීමයි.එසේ විදේශගත වී නැවත පවුල පිළිබද සොයා බැලීමක් සිදු නොකිරීම හා ඔවුන් වෙනත් විවාහයකට යොමු වීම තුළ ඇතැම් පවුල් අසරණ වී ඇති බව මෙහිදී නිරීක්ෂණය විය.

මෙහිදී අවධානයට ලක් වූ නෙත්මි දැරිය පිළිබද සැලකීමේදී ඇයගේ මව පවුලේ ආර්ථික අපහසුතා හේතුවෙන් විදේශගත වී ඇත.ඇයට විදේශගත වීම සදහා පියා ණය වී මුදල් සොයා ගෙන තිබේ.එහෙත් ඇය විදේශගත වූ පසු නිවස සමග සබදතා නවතා දමා ඇත.ඒ හේතුවෙන් පවුලේ ආර්ථිකය අඩාල වී තිබේ. විස්තෘත පවුලක් වන මෙම පවුලේ සාමාජිකයන්ගේ පෝෂණය සහ සුභසාධනය උදෙසා මාසිකව විශාල මුදලක් වැය වන බැවින් මෙම පවුල ආර්ථික අපහසුතා රාශියකින් පෙළෙන බව හදුනාගත හැකි විය.ඇයගේ මව විදේශගත වීම හේතුවෙන් සමෘධි දීමනාව ද ඔවුන්ගේ පවුලට නොලැබේ.මව විදේශගත වීමට ලබාගත් ණය මුදල් සදහා පොළියත් දිනෙන් දින එකතු වේ.එම මුදල ගෙවීමට පියාට හැකියාවක් නොමැත.නෙත්මිගේ අධ්‍යාපනය බිඳ වැටීමද මෙම කාරණාවට හේතු වී තිබේ.එබැවින් ලිංගික අපයෝජනයට ලක් වී විකල්ප රැකවරණයේ පසුවන මෙම ගැහැණු ළමුන්ගේ උපරිම යහපත ඇති කිරීමේදී ඔවුන්ගේ ආර්ථිකය ඉහළ නංවාලීමේ ක්‍රමවේදයක් අත්‍යාවශ්‍ය බව පෙනේ.

නියමු සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ ආණමඩුව පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිලධාරිවරයාගේ අදහස වූයේ මෙම පවුල සඳහා සමෘද්ධි සහනාධාරය හෝ ලබාදීමට හැකියාවක් නොමැති බවයි. එයට හේතුව මෙම දැරියගේ මව විදේශ ගතවීමයි. ඇයගේ මව විදේශගත වුවද විදේශ ගතවීමට ලබාගත් පොලී ණය මුදල් වසර දෙකක් තිස්සේ එකතු වී විශාල මුදලක් පොලී හිමියා වෙත ලබාදීමට සිදුවී තිබේ. කම්කරුවෙකු ලෙස කටයුතු කරන දැරියගේ පියා උපයන මුදල නිවසේ වියදමට පවා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඔවුන්ගේ දෛනික ජීවිතයට විශාල බලපෑමක් එල්ල වී ඇත. එම බලපෑම අනෙක් අතට දැරියගේ උපරිම යහපත කෙරෙහි තීරණාත්මකව බලපා ඇති බව පැහැදිළිය.

ලිංගික අපයෝජනයකට ගොදුරුවීමෙන් අනතුරුව විකල්ප රැකවරණයට යොමු කොට ඇති මෙම ගැහැණු ළමයින්ගේ උපරිම යහපත කෙරෙහි බලපාන්නා වූ තවත් එක් සාධකයක් වන්නේ ඔවුන්ගෙ 'නඩු විභාගය සදහා දීර්ඝ කාලයක් ගතවීමයි. මෙම අධ්‍යයනයේ සඳහන් සියලුම ගැහැණු ළමයින්ගේ අධිකරණ නඩු තවමත් අවසන් වී නැත. සමහරක් නඩු පොලිස් විමර්ශනයේ පවතින අතර ඇතැම් නඩු නීතිපති වෙත යොමු කොට තිබේ. ටානියා දැරියගේ නඩුව දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිළි වන්නේ ඇය ලිංගික අපයෝජනයට ගොදුරු වන විට ඇයගේ වයස අවුරුදු 14 ක් බවයි. මේ වන විට ඇගේ වයස අවුරුදු 16 යි මාස 02 කි. එම නඩුව වසර 02 කට වැඩි කාලයක් විභාග වෙමින් පවතී. සදලි දැරියගේ නඩුව දෙස අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැක්කේ ඇය ලිංගික අපයෝජනයට සඳහා ගොදුරු වන විට ඇයගේ වයස අවුරුදු 13 ක් බවයි. මේ වන විට ඇයගේ වයස අවුරුදු 16 කි. වසර 03 ක් තිස්සේ ඇයගේ නඩුවද

අධිකරණයේ විභාග වෙමින් පවතී. මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා සූදානමින් සිටින ඇයගේ අධ්‍යාපනික කටයුතු සහ අනෙකුත් සියලුම කටයුතු සඳහා මෙම නඩුව දිගින් දිගටම පැවතීම බලවත් අභියෝගයකි. ඇය සඳහන් කළේ ඇය පිළිබඳව පරිවාස නිලධාරීන් අධීක්ෂණය කිරීම ද ඇයට ගැටලු සහගත වී ඇති බවයි. තමාට සැකකරුගෙන් ශාරීරිකව හානියක් නොවූ නමුත් අධිකරණය, පොලීසිය හා පරිවාසය යන ආයතන වල නිලධාරීන්ගේ ක්‍රියාකළාපය හේතුවෙන් ඇය මානසික වශයෙන් අතෘප්තියෙන් පසුවන බව ඇය සඳහන් කරයි. දිගු කාලයක් තිස්සේ නඩු විභාගවීම මෙම ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සෘජුව හා වක්‍රාකාරව බලපාන බව ඉහත ප්‍රත්‍යයක අධ්‍යයනයන් තුළින් වඩාත් හොඳින් තහවුරු වේ.

පරිවාස නිලධාරීන් සමග පවත්වන ලද නියමු සම්මුඛ සාකච්ඡාවේදී ද ඒ පිළිබඳව තවදුරටත් කරුණු අනාවරණය විය.

*"ලිංගික අපයෝජන නඩුවක් අඩුම තරමින් අවුරුද්ක් ඇතුළතදී වත් අවසන් කරන්න පුළුවන් නම් ඒක මේ ළමයින්ගේ අනාගතයට හොඳයි. දිගින් දිගටම නඩු ප්‍රමාදවීම නිසා මේ ළමයින්ට ගොඩක් කාලයක් යනකන් අපේ අධීක්ෂණයේ තියාගන්න වෙනවා " (ස්ථානභාර පරිවාස නිලධාරී, නිකවැරටිය, 22/02/2022)*

මෙහිදී අනාවරණය වන වැදගත් කරුණු 02 ක් ඇත. ඉන් එක් කාරණයක් වන්නේ වැඩිකාලයක් පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණයේ පසුවීමට වින්දිත දැරියන් අකමැතිවීමයි. අනෙක් කාරණය වන්නේ එම දැරියන් පිළිබඳව දිගු කාලීනව අධීක්ෂණය කිරීමට පරිවාස නිලධාරීන් ද අකමැතිවීමයි. නඩු දිගින් දිගටම ප්‍රමාදවීම හේතුවෙන් මෙසේ දිගුකාලීනව පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණයට ළමුන් යොමු කරනු ලැබේ. තවද ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි පරිවාස නිලධාරින්ගේ අධීක්ෂණයෙහි ස්වරූපයද බලපාන බව මෙහිදී අනාවරණය විය.

මෙම ළමයින්ගේ උපරිම යහපතට පවතින අභියෝග හා බාධක අතරින් තවත් එක් වැදගත් බාධකයක් වන්නේ ළමුන් හා ඔවුන්ගේ පවුල සඳහා සුභසාධන සේවාවන් විධිමත්ව නොලැබීමයි. වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාශනයේ දැක්වෙන්නේ වයඹ පළාත තුළ අනාථ, අසරණ හා අත්හළ ළමුන් ශාරීරික, මානසික හා සදාචාරාත්මක වශයෙන් සංවර්ධනය කිරීමත්, ඔවුන් උදෙසා සියලු ආකාරයෙන් සුභසාධන කටයුතු හා රැකවරණය සැලැස්වීමත්, ළමා අයිතිවාසිකම් සහ ළමුන්ගේ සමාජ ගරුත්වය සුරක්ෂිත කිරීමත් තුළින් සංවර්ධනයේ සක්‍රීය කොටස්කරුවන් බවට පත්වීමයි. (මූලාශ්‍රය - කාර්ය සාධන වාර්තාව, 2020) ඒ අනුව ලිංගික අපයෝජනයෙහි වින්දිතයින් බවට පත්වී විකල්ප රැකවරණයේ සිටින ගැහැණු ළමුන්ගේ සුභසාධන කටයුතු සිදුකිරීමට දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කළ යුතුය.

පරිවාස නිලධාරීන් හා ස්ථානභාර පරිවාස නිලධාරීන් සමගින් සිදුකරන ලද නියමු සම්මුඛ සාකච්ඡාවන් මගින් පැහැදිළි වූ කරුණක් වන්නේ සුභසාධන සේවාවන් ප්‍රායෝගිකව සිදුකිරීමේදී ගැටළුකාරී තත්ත්වයන් රැසකට ඔවුන් මුහුණ දී සිටින බවයි.

*"ගෙවල් අනාරක්ෂිතව තිබෙන දරුවන්ගේ යහපත වෙනුවෙන් අපේ දෙපාර්තමේන්තුව මගින් නිවාස ආධාර ලබා දෙනවා. ඒ සඳහා රුපියල් ලක්ෂ 5 ක් එක් පවුලක් වෙනුවෙන් වෙන් කරනවා. ඒත් අද කාලෙ බඩු වල ගණන් බැලුවම ඒ ලක්ෂ පහට කුස්සියක්වත්*

*හදාගන්න අමාරුයි. ළමයින්ගේ භාරකරුවන්ගේ සහයෝගය ලැබුණොත් අපේ වෙනත් සම්බන්ධතාත් උපයෝගී කරගෙන කොහොමහරි කරලා ගේ හදලා සම්පූර්ණ කරගන්න පුළුවන්. ඒත් ඒක අමාරු වැඩක්. මේ අවුරුද්දේ ඉදලා නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන ඉදිරියට කරගෙන යන්න සල්ලි නෑ කියලා දෙපාර්තමේන්තුවේ අපව දැනුවත් කරලා තියෙනවා."* (ස්ථානභාර පරිවාස නිලධාරී, නිකවැරටිය, නියමු සම්මුඛ සාකච්ඡා 01, 19/02/2022)

නියමු සම්මුඛ සාකච්ඡාවේදී ලබාදුන් ඉහත තොරතුරු අනුව හඳුනාගත හැක්කේ මෙම දරුවන්ගේ සුභසාධනය උදෙසා මූල්‍යමය ආධාර ලබාදීම වර්තමානය වන විට ගැටලු සහගත වී ඇති බවයි. එබැවින් සුභසාධන සේවාවන් පුළුල්ව සිදුවන බවක් දක්නට නොලැබේ. අධ්‍යයනයට යොදා ගත් ගැහැණු ළමුන් 10 දෙනා වෙන් වෙන්ව ගෙන බැලීමේදී ඔවුන් සඳහා සමාන සේවාවන් මෙන්ම එකිනෙකාට වෙනස් වූ සුවිශේෂී සේවාවන් රැසක් ක්‍රියාත්මක කළ යුතුව පවතී. එහෙත් ඇතැම් සම්පත්වල සීමාවන් හේතුවෙන් ළමුන් වෙත ලැබිය යුතු සුභසාධන සේවාවන් විධිමත්ව නොලැබෙන බව මෙම පරීක්ෂණයේදී අනාවරණය විය.

මීට අමතරව සමාජ සහයෝගය විධිමත්ව නොලැබීම, ජාතික ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීම

ළමා අයිතිවාසිකම් පිළිබඳ ළමාරක්ෂණ නිලධාරීන්ගේ අඩුසැළකිල්ල, ළමුන්ගේ සමාජානුයෝජනයෙහි ගැටළු සහ විකල්ප රැකවරණය පිළිබඳ විධිමත් නියාමනයක් නොමැතිකම යනාදී අභියෝගයන්ද මෙම ප්‍රතිචාරකයින්ගේ උපරිම යහපත කෙරෙහි බලපා ඇති බව මෙම අධ්‍යයනය තුළ දී නිරීක්ෂණය විය.

මේ ආකාරයට ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි අභියෝග හා බාධක රාශියක් පවතින බව අධ්‍යයනය තුළදී තහවුරු වී තිබේ.

**ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා සමාජ වැඩ මැදිහත්කරණයෙහි අවශ්‍යතාවය**

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ පැහැදිලිව සඳහන් වන්නේ ළමයින් අයථා ලිංගික සබඳතා ඇතුළු අයථා ක්‍රියාවන්ට භාජනය කිරීමෙන් ළමයා ආරක්ෂා කර ගැනීම සඳහා පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් සියලුම යෝග්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය, සමාජීය සහ අධ්‍යාපනික පියවරයන් ගනු ලැබිය යුතු බවත් එම ආරක්ෂක වැඩ පිළිවෙලට ළමයාට සහ ළමයාගේ ආරක්ෂක රැකවරණය දරණ තැනැත්තන්ට අවශ්‍ය ආධාරය සලසන්නා වූ සමාජ වැඩ පිළිවෙලවල් පිහිටුවීම සඳහාද යෝග්‍ය වන්නා වූ වෙනත් ස්වභාවයේ ඵලදායී කාර්ය පටිපාටි ඇතුළත් විය යුතු බවයි. මෙමගින් සමාජ වැඩ වෘත්තිමය මැදිහත්වීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය වී තිබේ. සමාජ වැඩ මැදිහත්කරණය මගින් පුද්ගලයන්ගේ විභව ශක්තීන් ඉහළ නැංවීමට අවශ්‍ය සම්පත් ලබා දීමට කටයුතු කරන අතර පුද්ගලයාට නිදහස්ව සහ බුද්ධිමත්ව ක්‍රියාකිරීමට අවස්ථාව සලසාදීමත් ඒ තුළින් පුද්ගලයා කරා පැන නගින නොයෙක් සමාජ ගැටලු විසඳීම හා පුද්ගල සංවර්ධනය ගොඩනැගීම සඳහා අවශ්‍ය සවිබල ගැන්වීම් සිදුවේ. ඒතුළින් පුද්ගලයින්ගේ ජීවිතවලට බලපාන විවිධාකාර අභියෝගයන්ට මුහුණ දීමට හා පුද්ගල

යහපැවැත්ම වර්ධනය කිරීම සඳහා සමාජ වැඩ මැදිහත්කරණය නූතන සමාජයට අත්‍යාවශ්‍ය වී තිබේ.

සමාජ වැඩ වෘත්තිය මැදිහත්වීම මගින් අන්තර්කරණයට ලක් වූ ප්‍රජාවන්ගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත් ඔවුන්ට සමාජ සාධාරණත්වය ඇති කරලීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.පීඩාවට සහ ආබාධිත තත්ත්වයට පත් ව සිටින විවිධ පුද්ගල කොටස් වෙනුවෙන් පෙනී සිටිමින් ඔවුන් මුහුණ දී සිටින විවිධාකාර ගැටලු විසඳා ගැනීමට හා ඔවුන්ගේ ජීවිත තෘප්තිමත් කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සිදු කරනු ලබයි.එසේම ඔවුන් සංවර්ධන ක්‍රියාමාර්ගයට දායක කර ගැනීම සඳහා සුවිශේෂී භූමිකාවක් හා කාර්යභාරයක් සමාජ වැඩ මැදිහත්කරණය තුළ සිදුවේ.එබැවින් සමාජයේ අසාධාරණ තත්වයට පත්ව සිටින ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත උදෙසා කටයුතු කිරීමේදී සමාජ වැඩ වෘත්තිය මැදිහත්කරණයේ අවශ්‍යතාවය පිළිබඳ සොයා බැලීම ඉතා වැදගත් වේ.
ඒ අනුව ප්‍රධානතම සමාජ වැඩ මැදිහත්වීමේ මට්ටමේ ක්‍රියාදාමය ඔස්සේ සමාජ වැඩ මැදිහත්කරණයේ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමු කර යුතුය.

1 ක්ෂුද්‍ර මට්ටමේ මැදිහත්කරණය
2 මධ්‍යම මට්ටමේ මැදිහත්කරණය
3 සාර්ව මට්ටමේ මැදිහත්කරණය

ක්ෂුද්‍ර මට්ටමේ සමාජ වැඩ මැදිහත්කරණයේදී ලිංගික අපයෝජනයෙන් වින්දිතභාවයට පත්ව විකල්ප රැකවරණය යටතේ පසුවන ගැහැණු ළමයින් හා ඔවුන්ගේ පවුල් සමග කටයුතු කිරීම සමාජ වැඩ වෘත්තිකයින් හට සිදුවේ.එම මැදිහත්කරණය ප්‍රත්‍යෙයක සමාජ වැඩ ඔස්සේ සිදුකළ හැකිය.ක්ෂුද්‍ර මට්ටමේ මැදිහත්කරණය මගින් කායික,මානසික,ආධ්‍යාත්මික, සමාජ හා සංස්කෘතික යන සෑම අංශයෙහිම මානව චර්යාවන් ළමා සබඳතාවක් සහිත ළමුන් පිරිසක් බිහි කිරීමට අවස්ථාව සැලසේ.එමෙන්ම මෙම ළමුන්ගේ යහපැවැත්ම,ආරක්ෂාව,සුභ සාධනය හා පුනරුත්ථාපනයට අවශ්‍ය ඵලදායි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හැකියාව ලැබේ.

මධ්‍යම මට්ටමේ සමාජ වැඩ මැදිහත්කරණය මගින් මිනිස් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින හා ප්‍රජාව සමග වැඩ කිරීමට සමාජ වෘත්තිකයන්ට හැකියාව ඇත.එසේම ලිංගික අපයෝජනයට ගොදුරු වීම විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන් කණ්ඩායම් ලෙස යොදාගනිමින් ප්‍රතිකරාත්මක , තීරණාත්මක හා සංවර්ධනාත්මක ප්‍රාවේශයක් ඔස්සේ ඔවුන්ගේ උපරිම යහපත සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව ලැබේ. මනෝවිද්‍යාත්මක උපදේශන සේවා,නීති ආධාර සේවා මෙන්ම වෙනත් ආකාරයේ සුභසාධන සේවා මෙම ළමුන්ගේ උපරිම යහපත උදෙසා ඵලදායක අන්දමින් යොදා ගැනීමට මධ්‍යම මට්ටමේ සමාජ වැඩ මැදිහත්කරණය තුළින් හැකියාව ලැබේ.

සාර්ව මට්ටමේ සමාජ වැඩ මැදිහත්කරණය මගින් ළමුන්ගේ යහපැවැත්ම උදෙසා ක්‍රියාත්මක ජාත්‍යන්තර හා ජාතික ප්‍රතිපත්ති පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ හැකිය. සමාජ වැඩ ප්‍රවේශයක් වන අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශය මෙහිදී ඉතා වැදගත් වේ. ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ

උපරිම යහපත උදෙසා කටයුතු කිරීමේදී වැදගත් වන ප්‍රධානතම ජාත්‍යන්තර යාන්ත්‍රණය වන ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1989) මෙහිදී ඉතා වැදගත් වන අතර එම සම්මුතියට අනුව යමින් ශ්‍රී ලංකාව සම්මත කරගත් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය විසින් ළමුන්ගේ උපරිම යහපත උදෙසා කටයුතු කිරීමේදී අත්‍යාවශ්‍ය වේ.එසේම ශ්‍රී ලංකාවේ 2019 වර්ෂයේදී සම්මත වූ ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, 2018 දී සම්මත වූ ශ්‍රී ලාංකීක දරුවන්ට එරෙහි සියලුම ආකාරයේ හිංසනයන් වැළැක්වීම පිළිබඳ ජාතික මාර්ගෝපදේශ හා 2019 දී සම්මත වූ ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය සාර්ව මට්ටමේ සමාජ වැඩ මැදිහත්කරණයේදී ඉතාවැදගත් වන්නාවූ සමාජ ප්‍රතිපත්තීන් වේ. මෙම ප්‍රතිපත්තීන් මගින් ජාත්‍යන්තර හා ජාතික වශයෙන් ළමුන්ගේ උපරිම යහපත ඇතිකිරීම සඳහා ලබා දී ඇති මාර්ගෝපදේශයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේ ද එසේ ක්‍රියාත්මක නොවන්නේ නම් ඒවා අදාල වගකිව යුතු ආයතන සහ නිලධාරීන් ලවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම සඳහා සමාජ වැඩ වෘත්තීය මැදිහත්කරණයක් අවශ්‍ය වී තිබේ.

මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වූ කාරණා පිළිබඳව ගැඹුරින් අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැක්කේ ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේදී සමාජවැඩ මැදිහත් වීමක් කඩිනමින් සිදුවිය යුතු බවයි. එහිදී මෙම පර්යේෂණය තුළදී හඳුනාගත් උපරිම යහපත සඳහා පවතින අභියෝග හා බාධක ආමන්ත්‍රණය කළ යුතුව ඇත. එසේ සිදු කිරීමෙන් ළමුන්ගේ ආරක්ෂාව, සංවර්ධනය, යහපැවැත්ම, සුභසාධනය හා පුනරුත්ථාපනය උදෙසා ඵලදායි වූ සමාජවැඩ මැදිහත්කරණයක් යොදා ගැනීමට හැකියාව තිබේ.

සියදිවි නසා ගැනීමේ සිතුවිලි සමගින් කල්ගෙවන නිම්නා දැරිය,ඇබ්බැහිකාරී තත්වයට පත් ව ඇති නදී දැරිය,දැඩි කලකිරීමෙන් පසුවන ටානියා දැරිය මෙන්ම මානසික ප්‍රතිකාර සඳහා යොමු වී සිටින සුපුනි දැරිය යන ගැහැණු ළමුන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඔවුන් සියලු දෙනා සඳහා සමාජ වැඩ මැදිහත්කරණයක් කඩිනමින් අවශ්‍ය බව පෙනේ. එහිදී ප්‍රථමයෙන්ම ඔවුන්ගේ ආරක්ෂාව කෙරෙහි සැලකිලිමත් විය යුතු අතර අනතුරුව සංවර්ධනය හා යහපැවැත්ම පිළිබඳ සැලකිලිමත් විය යුතුය. අනතුරුව ඔවුන්ගේ පුනරුත්ථාපනය හා සුභසාධනය සඳහා ද සමාජ වැඩ වෘත්තිය මැදිහත්කරණය යොදා ගත යුතුය.

මීට අමතරව අනෙකුත් ළමුන්ගේ උපරිම යහපත සඳහාද සමාජ වැඩ වෘත්තිය මැදිහත්කරණය අවශ්‍ය වී තිබේ.එහිදී ඔවුන්ගේ සංවර්ධනයට මෙන්ම ආරක්ෂාව, යහපැවැත්ම හා සුභසාධනයට සමාජ වැඩ මැදිහත්කරණය අත්‍යවශ්‍ය වේ.

**සමාලෝචනය හා නිගමන**

ළමා ලිංගික අපයෝජනය ලෝකයේ සෑම රටකම පවතින ප්‍රබල සමාජ ප්‍රශ්ණයකි.ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වීම හේතුවෙන් ළමුන්ගේ සංවර්ධනයට, ආරක්ෂාවට,යහපැවැත්මට මෙන්ම ළමා අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට ප්‍රබල තර්ජනයක් සහ බලපෑමක් සිදුවේ.ලොව පුරා ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වන ළමුන් අතරින් වැඩිම පිරිසක් ගැහැණු ළමුන් වේ.ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වීමේ

ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ පසුකාලීන සංවර්ධනයට හා යහපැවැත්මට වන බලපෑම අතිවිශාලය.ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වූ දරුවන් සඳහා විවිධ රැකවරණ ක්‍රමවේදයන් නූතනයේ ක්‍රියාත්මක වේ.එම රැකවරණ ක්‍රම අතරින් විකල්ප රැකවරණය වඩාත් වැදගත් රැකවරණ ක්‍රමයයි.විකල්ප රැකවරණයේ දී ආයතනගත රැකවරණයට වඩා ප්‍රජා පාදක රැකවරණය ගැහැණු ළමුන්ගේ උපරිම යහපත උදෙසා වැඩි බලපෑමක් සිදු කරනු ලබයි.

මෙම අධ්‍යයනයේදී ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ පසුබිම,ඔවුන්ගේ උපරිම යහපත සිදුවන ආකාරය,උපරිම යහපත කෙරෙහි ඇති අභියෝග හා බාධක මෙන්ම ඔවුන්ගේ උපරිම සඳහා සමාජ වැඩ මැදිහත්කරණයේ අවශ්‍යතාවය පිළිබඳව සොයාබැලීමක් සිදුකරන ලදී. මෙහිදී අයිතිවාසිකම් පදනම් කරගත් සමාජ වැඩ ප්‍රවේශය ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත. ඒ අනුව මෙම අධ්‍යයනය තුළදී අනාවරණය වූ තොරතුරු පදනම් කර ගනිමින් පහත සඳහන් නිගමනයන්ට එළඹෙන ලදී. මෙම පර්යේෂණයේදී ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන නවයොවුන් වියේ ගැහැණු ළමුන්, ඔවුන්ගේ භාරකරුවන් හා ඔවුන් පිළිබඳ අධීක්ෂණය කරනු ලබන පරිවාස නිලධාරීන් යන ප්‍රතිචාරකයින් ලබා දුන් මූලික දත්ත හා ළමාරක්ෂණ නිලධාරියෙකු ලෙස පර්යේෂකයාගේ අත්දැකීම් මෙන්ම ද්විතික දත්ත උපයෝගී කර ගනිමින් ගුණාත්මක විශ්ලේෂණයක් ඔස්සේ සිදු කරන ලද අතර පර්යේෂණයෙන් හඳුනාගත් තොරතුරු ඇසුරින් පහත සඳහන් නිගමන ඉදිරිපත් කරනු ලැබේ.

අධ්‍යයනයට ලක් වූ ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ පවුල් පසුබිම ඔවුන් ලිංගික අපයෝජනයට ගොදුරු වීමෙහිලා ප්‍රබල බලපෑමක් එල්ල කොට ඇත. සමාජයේ මූලික ඒකකය වන පවුල තුළ ළමයෙකුට හිමිවිය යුතු රැකවරණය නිසිලෙස නොලැබීම තුළ ඔවුන් බහුතරයක් මෙසේ ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ. ප්‍රතිචාරකයින්ගේ බහුතරයක් පවුල් බිඳුණු පවුල් පසුබිමකින් යුක්ත වේ. ඒ හේතුවෙන් මෙම ගැහැණු ළමුන්ගේ සමාජානුයෝජනය අහිතකර ආකාරයට සිදු වීමෙන් ළමා සංවර්ධනයට බාධක පැමිණ තිබේ. එහිදී ළමුන්ගේ ආරක්ෂාවට ප්‍රබල බලපෑමක් එල්ල වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස නව යොවුන් වියේදී ඔවුන් ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ. ප්‍රතිචාරකයින් බහුතරයක් සිංහල බෞද්ධ වේ. අධ්‍යයනය සඳහා යොදාගත් ප්‍රතිචාරකයින්ගෙන් එක් ප්‍රතිචාරකයෙක් පමණක් කතෝලික ආගමට අයත් විය. මොවුන් සියලුම දෙනා ග්‍රාමීය සංස්කෘතියක හැදී වැඩී ඇත. මොවුන්ගේ අධ්‍යයන පසුබිම පිළිබඳව හඳුනාගත හැක්කේ 08 ක් 09 ශ්‍රේණිය හෝ 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇති බවයි. අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනයට යොමු වී ඇත්තේ ප්‍රතිචාරකයින් එක් අයෙකු පමණි.

ප්‍රතිචාරකයින්ගේ ආර්ථික පසුබිම පිළිබඳ හඳුනාගත හැක්කේ වැඩි දෙනෙක් අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයන් බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මව හෝ පියා විදේශගතවීමෙන් ළමුන් අනාරක්ෂිත වීමක් සිදු වී ඇත. ප්‍රතිචාරකයින් ගොදුරු වී ඇති ලිංගික අපයෝජනයෙහි ස්වභාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී නියැදීන් 08 ක් ස්ත්‍රී දූෂණය සඳහා ගොදුරු වී තිබේ. ස්ත්‍රී දූෂණයට ගොදුරු වූ ගැහැණු ළමුන් තිදෙනෙකු ළමා

මව්වරු බවට පත්ව ඇත. තිබේ. එක් සිද්ධියකදී පමණක් අශ්ශීල ආකාරයේ ප්‍රදර්ශනයක් මගින් ගැහැණු ළමයෙකු ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ. ස්ත්‍රී දූෂණයට ගොදුරු වූ ළමුන්ගෙන් බහුතරයක් අඩුවයසින් ප්‍රේම සම්බන්ධතා වලට යොමු වී එය කැමැත්තෙන් ලිංගික අපයෝජනයට ගොදුරු වී ඇත. එක් ස්ත්‍රී දූෂණ සිදුවීමක් බලහත්කාරයෙන් සිදු වී තිබෙන අතර සියලුම ස්ත්‍රී දූෂණ වැරදි ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයට අයත් වන බව නිගමනය වේ. තවද එක් සිද්ධියක් දණ්ඩ නීති සංග්‍රහයෙහි ව්‍යභිචාරය වරදට අයත් වන බව හදුනා ගත හැකි වුවද පොලිසිය නඩු පවරා ඇත්තේ ස්ත්‍රී දූෂණ වරදටය. ප්‍රතිචාරකයින් සියලුමදෙනා විකල්ප රැකවරණයට යොමුකොට ඇත්තේ විධිමත් ආකාරයේ අධිකරණ තීන්දුවක් මගිනි. මොවුන් සියලුම දෙනා ප්‍රජාපාදක විකල්ප රැකවරණයේ පසුවේ. ඉන් 04ක් සුදුසු පුද්ගල පරිලෝචන නියෝගයක් මත ඥාතීන් වන සුදුසු පුද්ගලයන් වෙත ලබා දී තිබේ. දෙමාපියන් වෙත ලබා දී ඇති දරුවන් පරිලෝචන නියෝගයක් මගින් ඔවුන් වෙත භාර දී තිබේ. සුදුසු පුද්ගල පරිලෝචන නියෝග මෙන්ම පරිලෝචන නියෝග මාස 06, අවුරුද්ද, අවුරුදු 02 හා අවුරුදු 03 යනාදී ලෙස ලබා දී ඇත. ළමයින් සහ යෞවනයන් පිළිබද ආඥාපනත (1939) අනුව ළමයෙකු සහ යෞවනයෙකු සඳහා ඉහත නියෝග පැනවීමට අධිකරණයට බලය තිබේ. එහෙත් වයස අවුරුදු 16 සම්පූර්ණ වූ පසු එවැනි නියෝගයක් පැනවීමට ළමයින් හා යෞවනයින් පිළිබද ආඥා පනතට අනුව අධිකරණයට හැකියාවක් නොමැත.

මෙම ළමුන්ගේ උපරිම යහපත සිදුවන ආකාරය පිළිබඳ පරීක්ෂා කිරීමේදී හඳුනාගත හැකිවූයේ සියලුම ළමුන්ගේ උපරිම යහපත නිසි ආකාරයෙන් සිදු නොවන බවයි. ඔවුන්ගේ සංවර්ධනයට, ආරක්ෂාවට, යහපැවැත්මට, ශුභසාධනයට හා පුනරුත්ථාපනය නිසි ලෙස සිදුනොවන බව නිරීක්ෂණය විය. ඒ සඳහා සාධක ගණනාවක් බලපා තිබේ. මෙම ළමුන්ට එක්සත් ජාතීන්ගේ සංවිධානය 1989 දී සම්මත කළ ළමා අයිතිවාසිකම් පිළිබද ජාත්‍යන්තර ප්‍රඥප්තියේ සදහන් ළමා අයිතිවාසිකම් රාශියක් උල්ලංඝනය වී ඇත. එහි සදහන් ප්‍රධානතම මූලධර්මයක් වන උපරිම යහපත පිළිබද මූලධර්මය ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන බව මෙහිදී හදුනාගත හැකි විය.ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේ දී සමාජ වැඩ මැදිහත්කරණය අත්‍යවශ්‍ය බව නිගමනය කළ හැකිය. සමාජ වැඩ මැදිහත්කරණය ක්ෂුද්‍ර මට්ටමින්, මධ්‍යම මට්ටමින් මෙන්ම සාර්ව මට්ටමින් සිදු කළ යුතුය. එහිදී ප්‍රතිකාරාත්මක, නිවාරණාත්මක හා සංවර්ධනාත්මක ප්‍රවේශයක් ඔස්සේ එය සිදු කළ යුතුය. පවතින සේවාවන් මෙම ප්‍රතිචාරකයන් වෙත වඩාත් හොදින් සම්බන්ධීකරණය සදහා සමාජ වැඩ මැදිහත්කරණය කාලීන අවශ්‍යතාවයක් වන බව පෙනේ. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පසුවන විකල්ප රැකවරණයට යොමුකොට ඇති මෙම ගැහැණු ළමුන්ගේ ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ සදහා "උපරිම යහපත" නැමති සංකල්පය ඵලදායි ලෙස යොදා ගැනීමට අවශ්‍ය නෛතික පසුබිම නිර්මාණය වී ඇතත් ප්‍රායෝගිකව එය සිදුවන ආකාරයක් දක්නට නොලැබෙන බව හදුනාගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


කරුණාරත්න, බී. කේ. එස්., (2016). ලිංගික අපයෝජනයට ගොදුරු වී ආයතනගත වන ගැහැණු ළමුන් නැවත සමාජගත කිරීමේ දී මනෝ විද්‍යාත්මක උපදේශනය ඵලදායී ලෙස යොදාගත හැකි ආකාරය පිළිබඳ විමසුමක්''. *ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සගරාව*. නාවලː ජාතික සමාජ සංවර්ධන ආයතනය. පළමු කලාපය. පිටු අංක 19-46.

කරුණාරත්න, කේ. එම්. වයි. සහ සන්ධ්‍යා. එච්. කේ., (2016). ''ආයතනගත ළමුන්ගේ පෞරුෂය සංවර්ධනය සඳහා සමාජ වැඩ ප්‍රවේශයන්ගේ භාවිතය''. *ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සගරාව.* නාවලː ජාතික සමාජ සංවර්ධන ආයතනය. පළමු කලාපය. පිටු අංක 19-46.

*ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය.* (2019). බත්තරමුල්ලː පරිවාස හා ළමා රක්ෂණසේවා දෙපාර්තමේන්තුව, කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාපීය සංවර්ධන අමාත්‍යාංශය.

සුබසිංහ, වසන්තා, (2019 ). *සංස්කෘතිය සහ සංවර්ධනය.* කතෘ ප්‍රකාශනයකි.

සුබසිංහ, වසන්තා, (2017 ). *සමාජ පර්යේෂණ ක්‍රම.* කතෘ ප්‍රකාශනයකි.
*ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය.* (1989). කොළඹː එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල.

Babbie, E., & Mouton, J. (2001). *The practice of social research. Southern Africa*: Oxford University Press.

Helseth S., Haraldstad K. (2014) Child Well-Being. In: Michalos A.C. (eds) Encyclopedia of Quality of Life and Well-Being Research. Springer, Dordrecht. https://doi.org/10.1007/978-94-007-0753-5_339

*International Federation of Social Workers* (IFSW). (2012). Human rights. Retrieved from: https://www.ifsw.org/what-is-social-work/global-definition-of-social-work/.

*International Federation of Social Workers* (IFSW). (2014). Global definition of social work. Retrieved from: https://www.ifsw.org/what-is-social-work/global-definition-of-social- work/.
UNICEF. (2007). Child poverty in perspective: *An overview of Child well-being in rich countries*. Innocenti report card 7. Florence: UNICEF